
# 4. කර්මාන්ත


## 4.1 සමස්ත උපනතීන්

දේශීය වෙළෙඳපොළ කෙරෙහි යොමු වූ කර්මාන්තයන්හි ඉහළ වර්ධනයක් පිළිබිඹු කරමින් 1998 වර්ෂයේ දී කර්මාන්ත අංශයේ නිෂ්පාදනය සියයට 7.5 කින් වර්ධනය විය. 1997 වර්ෂයේ පැවැති වර්ධනය සියයට 10.2 ක් විය. පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන, සිමෙන්ති, ගොඩනැගිලි උපකරණ, තිරිඟු පිටි, සත්ව ආහාර, මත්පැන්, කිරි නිෂ්පාදන, ඖෂධ වර්ග, පාන වර්ග සහ රසායන ද්‍රව්‍ය වැනි දේශීය වෙළෙඳපොළ කෙරෙහි යොමු වූ නිෂ්පාදන සැළකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. අපනයනාභිමුඛ කර්මාන්තයන්හි මිශ්‍ර වර්ධනයක් පෙන්නුම් කරමින්, ධීවර නිෂ්පාදන සහ රබර් භාණ්ඩ නිෂ්පාදනයන්ගේ ඉහළ යාමක් සහ දියමන්ති, මැණික් සහ ස්වර්ණාභරණ වැනි අනෙකුත් අපනයන නිෂ්පාදනයන්ගේ පහත වැටීමක් වාර්තා විය. ජාත්‍යන්තර තරගකාරිත්වය හමුවේ නොකඩවා ප්‍රසාරණය වූ ඇඟලුම් කර්මාන්තය වසරේ අවසාන භාගයේදී මන්දගාමී වර්ධනයක් පෙන්නුම් කළේය. කාර්මික නිෂ්පාදන වටිනාකමෙන් සියයට 84 ක් වන කම්හල් කර්මාන්ත, 1998 වර්ෂයේදී සමස්ත ආර්ථික වර්ධනය සඳහා සියයට 28 ක දායකත්වයක් ලබාදී ඇත. කර්මාන්ත අංශයේ ධාරිතාවය 1998 දී සියයට 4 කින් ඉහළ ගියේය. ආයෝජන මණ්ඩලයට අයත් නොවන ව්‍යවසායයන්ගේ ශ්‍රම ඵලදායීතාවද සියයට 4 කින් වර්ධනය වී ඇති බව ඇස්තමේන්තු කර ඇත.

කර්මාන්ත අංශයේ මෙම වර්ධනය ලඟා කරගෙන ඇත්තේ නැගෙනහිර ආසියාවේ මූල්‍ය අර්බුදය හේතුවෙන් ජාත්‍යන්තර වෙළඳම තුනෙන් දෙකකින් පමණ පහත වැටීම සහ ඉන් පසුව රුසියාව, ජපානය සහ ඇතැම් දකුණු සහ මධ්‍යම ඇමෙරිකානු රටවල් ඇතුළු බොහෝ රටවල ඇති වූ නොයෙකුත් ආර්ථික ගැටළු මධ්‍යයේය. අර්බුදය හේතුවෙන් නැගෙනහිර ආසියානු මුදල් විශාල වශයෙන් අවප්‍රමාණ කිරීම සහ ලෝකයේ සෙසු රටවල සාමාන්‍ය මට්ටමක පැවති ශ්‍රම පිරිවැය සහ උද්ධමනය මගින් ජාත්‍යන්තර වෙළෙඳපළෙහි තරගකාරිත්වය උත්සන්න කෙරිණි. කෙසේ වෙතත්, රුපියලේ අගය වේගයෙන් අවප්‍රමාන වීම දේශීය කර්මාන්තවල තරගකාරිත්වය ඉහළ මට්ටමක පවත්වාගැනීමට උපකාරී විය. ආසියා-පැසිපික් කලාපයේ ආර්ථික පසුබෑස්ම නිසා සකස් කළ දියමන්ති, ස්වර්ණාභරණ සහ පිඟන් භාණ්ඩ නිෂ්පාදන සඳහා වූ අපනයන ඉල්ලුම පහත වැටුණි. කෙසේ නමුත්, සැපයුමේ නිශ්චිතතාවය සහ භාණ්ඩවල ගුණාත්මක තත්ත්වය පිළිබඳව සැලකිලිමත් වන ප්‍රධාන ගැනුම්කරුවන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදකයන් වෙත නොකඩවා ඇනවුම් ලබා දීම නිසා සමහර ප්‍රධාන අපනයනාභිමුඛ කර්මාන්තයන්හි ක්‍රියාකාරිත්වය සතුටුදායක විය. තවද, විශාල පරිමාණයේ බොහෝ අපනයනකරුවන් ඔවුන්ගේ හවුල් ව්‍යාපාර මගින් කටයුතු කරමින් ප්‍රධාන ජාත්‍යන්තර ගැනුම්කරුවන් සමඟ ශක්තිමත් වෙළෙඳ සම්බන්ධතා පවත්වා ගැනීමට සමත් විය. එසේ වුවද, තරගකාරිත්වය පවත්වා ගැනීම සඳහා ඉහළ වට්ටම් පිරිනැමීමට කර්මාන්තකරුවනට සිදු විය.

4.1 රූප සටහන
**කාර්මික නිෂ්පාදන වර්ධනය සහ සංයුතිය**




1. ආහාර, පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත
2. රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත
3. දැව හා දැව නිෂ්පාදිත
4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත
5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත
6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත
7. මූලික ලෝහ නිෂ්පාදිත
8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර හා ප්‍රවාහන උපකරණ
9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත

පසුගිය වසර කීපය තුල අයවැය ලේඛන මඟින් හඳුන්වා දෙන ලද, කර්මාන්තවල උසස් තාක්ෂණ භාවිතය සඳහා වූ රාජ්‍ය මූල්‍ය දිරිදීම්, ආයෝජන මණ්ඩලයට අයත් නොවන අපනයනකරුවන් සඳහා විදේශ ණය මුදල් ලබා ගැනීමට අවස්ථාව සලසා දීම, රෙදිපිළි ආනයන ලිහිල් කිරීම වැනි ප්‍රතිපත්ති සහ පෙර වර්ෂවල පැවති ඉහළ පොලී අනුපාතිකයන්ට සාපේක්ෂව අඩු මට්ටමක පැවැති පොලී අනුපාතිකයන් කර්මාන්ත අංශයේ වර්ධනය සඳහා ඉවහල් විය. නිෂ්පාදන ධාරිතාවය ප්‍රසාරණය වූ අතර, කර්මාන්ත විවිධාංගීකරණය විය. තීරු බදු ඉවත් කිරීමෙන් සිදු වූ වාසිය ප්‍රයෝජනයට ගනිමින් වර්ෂය තුලදී ආයෝජන භාණ්ඩ ආනයනය සියයට 12 කින් ඉහළ යාම, දැනට පවත්නා කර්මාන්ත නවීකරණය වීමට සහ නව කර්මාන්තශාලා ආරම්භ වීමට හේතු විය. උසස් තාක්ෂණය සඳහා වූ ආයෝජන ඉහළ යාම බොහෝ කර්මාන්තවල (උදා. පළතුරු සහ මස් සැකසුම් කර්මාන්ත, රබර් සහ ඇඟළුම් කර්මාන්ත) ඵලදායීතාව වර්ධනයට හේතු වූ අතර වැටුප් හා වේතනවල මධ්‍යස්ථ වර්ධනයේ අයහපත් ප්‍රතිඵල අවම කිරීමට ද උපකාරී විය.

ඇතැම් නිෂ්පාදකයින් ඵලදායිතා වර්ධනය කිරීම සඳහා සේවකයන් දැනුවත් කිරීම, අපතේ යාම් අඩු කිරීමේ ක්‍රම හඳුන්වා දීම සහ නිපුණතා වර්ධනය වැනි ක්‍රියාමාර්ග භාවිතා කර ඇත. ශ්‍රී ලංකා රුපියලෙහි අගය අඩු වීම, දේශීය උද්ධමනය පහත වැටීම සහ පසුගිය වර්ෂවල පැවැති ඉහළ අනුපාතිකයන්ට සාපේක්ෂව බැංකු ණය පොලී අනුපාතිකයන් පහල මට්ටමක පැවැතීම කර්මාන්ත අංශයෙහි බාහිර තරගකාරිත්වය වර්ධනය කිරීමට උපකාර විය. විශාල වශයෙන් අවප්‍රමාණයවූ මුදල් සහිත නැගෙනහිර ආසියාවේ රටවලින් කර්මාන්ත සඳහා අමු ද්‍රව්‍ය සැලකිය යුතු ප්‍රමාණයක් ආනයනය කිරීම අන්තර් භාණ්ඩ යෙදවුම් පිරිවැය පහත වැටීමට හේතු විය. කර්මාන්ත අංශයේ කම්කරු සබඳතා වර්ධනය වීමද 1998 වර්ෂයේදී ඇති වූ හිතකර වර්ධනයකි. විදුලි බලය, පණිවුඩ හුවමාරුව සහ වරාය පහසුකම් වැනි මූලික කර්මාන්ත යටිතල පහසුකම්වල සැලකිය යුතු වර්ධනයක් ඇති වීම සහ කාර්මික උද්‍යාන වැඩපිළිවෙල යටතේ යටිතල පහසුකම් වර්ධනය කිරීම කාර්මික කටයුතු සඳහා නව ආයෝජකයන් උනන්දු කළේය. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය සහ ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වූ විශාල පරිමාණ නිෂ්පාදන ව්‍යාපාර 201 ක් වර්ෂය තුලදී වාණිජමය නිෂ්පාදන ආරම්භ කර ඇත. එමෙන්ම, කළමණාකරණ ගැටළු සහ වෙනත් දුෂ්කරතා හේතුවෙන් වසර තුලදී ආයතන 37 ක් තාවකාලිකව නිෂ්පාදන කටයුතු අත්හිටවා ඇත. කාලීන අවශ්‍යතා අනුව මානව නිපුණතා සහ යන්ත්‍රෝපකරණ වර්ධනයට අමතරව මාර්ග සහ ප්‍රවාහන පද්ධති, වරාය පහසුකම් සහ පණිවුඩ හුවමාරු ජාලයන්හි වැඩිදුර සංවර්ධනයක් කර්මාන්ත අංශයෙහි වේගවත් වර්ධනයක් සඳහා අත්‍යාවශ්‍ය වේ. නිපුණ ශ්‍රමය සඳහා පවතින ඉල්ලුම සමඟ සැපයුම නොගැලපීම සහ ශ්‍රම වෙළෙඳපොළෙහි දක්නට ඇති අනම්‍යශීලී බව කර්මාන්ත අංශයේ වේගවත් ප්‍රසාරණයන් සඳහා පවතින සංරෝධකයන් වේ.

**4.1 සංඛ්‍යා සටහන**

**කර්මාන්ත අංශයේ නිෂ්පාදන වටිනාකම**

**(1990 ස්ථාවර මිල අනුව)**

| කාණ්ඩය | රුපියල් දශලක්ෂ | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1994 | 1995 | 1996 | 1997 | 1998 (අ) | 1997 | 1998(අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 30,445 | 33,641 | 35,908 | 37,146 | 40,729 | 3.4 | 9.6 |
| ආහාර සහ වෙනත් | 17,526 | 18,936 | 20,314 | 21,343 | 23,787 | 5.1 | 11.5 |
| මත්පැන් | 2,251 | 2,630 | 3,027 | 2,961 | 3,458 | -2.2 | 16.8 |
| පාන වර්ග | 5,023 | 5,961 | 6,104 | 7,032 | 7,686 | 15.2 | 9.3 |
| දුම්කොළ නිෂ්පාදිත | 5,645 | 6,114 | 6,463 | 5,810 | 5,798 | -10.1 | -0.2 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 48,333 | 55,480 | 58,332 | 69,269 | 72,391 | 18.7 | 4.5 |
| ඇඟළුම් | 40,353 | 46,702 | 49,292 | 59,280 | 62,050 | 20.3 | 4.7 |
| රෙදිපිළි | 5,509 | 6,202 | 6,299 | 6,926 | 7,226 | 10.0 | 4.3 |
| සම් භාණ්ඩ | 2,471 | 2,576 | 2,741 | 3,063 | 3,115 | 11.7 | 1.7 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 1,085 | 1,243 | 1,321 | 1,334 | 1,378 | 1.0 | 3.3 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 3,565 | 3,508 | 3,550 | 3,561 | 3,446 | 0.3 | -3.2 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 25,838 | 27,543 | 31,135 | 32,582 | 36,841 | 4.6 | 13.1 |
| රසායනික ද්‍රව්‍ය,තීන්ත වර්ග සහ පොහොර | 2,173 | 2,735 | 3,091 | 3,584 | 4,049 | 15.9 | 13.0 |
| රබර් | 3,091 | 3,956 | 4,660 | 5,539 | 6,004 | 18.9 | 8.4 |
| ප්ලාස්ටික් සහ පීවීසී | 2,284 | 2,754 | 3,113 | 3,584 | 3,874 | 15.1 | 8.1 |
| ඖෂධ,සනීපාරක්ෂක ද්‍රව්‍ය සහ අනෙකුත් | 6,072 | 6,885 | 7,784 | 8,797 | 9,853 | 13.0 | 12.0 |
| ඛනිජ තෙල් | 12,218 | 11,213 | 12,487 | 11,078 | 13,061 | -11.3 | 17.9 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 11,643 | 12,516 | 13,360 | 13,914 | 14,629 | 4.1 | 5.1 |
| දියමන්ති සැකසීම | 4,445 | 4,630 | 4,542 | 4,453 | 4,059 | -2.0 | -8.8 |
| පිඟන් නිෂ්පාදන | 1,688 | 1,867 | 2,138 | 2,226 | 2,302 | 4.1 | 3.4 |
| සිමෙන්ති | 3,039 | 3,316 | 3,607 | 3,896 | 4,628 | 8.0 | 18.8 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය සහ වෙනත් | 2,471 | 2,703 | 3,073 | 3,339 | 3,640 | 8.7 | 9.0 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 1,568 | 1,377 | 1,636 | 1,671 | 1,856 | 2.1 | 11.1 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 5,931 | 6,139 | 6,252 | 7,437 | 8,235 | 19.0 | 10.7 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 2,617 | 3,005 | 3,443 | 3,904 | 4,093 | 13.4 | 4.8 |
| එකතුව | 131,025 | 144,452 | 154,937 | 170,818 | 183,598 | 10.2 | 7.5 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික

**4.2 සංඛ්‍යා සටහන**

**පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදන දර්ශකය**

**(1990 ස්ථාවර මිල අනුව)**

1990=100

| කාණ්ඩය | දර්ශකය | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1994 | 1995 | 1996 | 1997 | 1998 (අ) | 1997 | 1998(අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 140 | 155 | 166 | 172 | 188 | 3.4 | 9.7 |
| *ආහාර සහ වෙනත්* | 145 | 155 | 166 | 176 | 196 | 5.9 | 11.4 |
| *මත්පැන්* | 137 | 160 | 183 | 177 | 207 | -3.3 | 16.8 |
| *පාන වර්ග* | 148 | 175 | 180 | 207 | 226 | 15.2 | 9.3 |
| *දුම්කොළ නිෂ්පාදිත* | 118 | 128 | 135 | 121 | 121 | -10.1 | -0.2 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 179 | 206 | 217 | 258 | 269 | 18.7 | 4.5 |
| *ඇඟළුම්* | 193 | 223 | 235 | 283 | 297 | 20.3 | 4.7 |
| *රෙදිපිළි* | 151 | 171 | 174 | 191 | 199 | 10.0 | 4.3 |
| *සම් භාණ්ඩ* | 156 | 162 | 172 | 193 | 196 | 11.7 | 1.7 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 149 | 170 | 165 | 165 | 163 | -0.3 | -1.1 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 263 | 266 | 279 | 287 | 289 | 2.8 | 0.8 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 159 | 196 | 224 | 257 | 286 | 14.7 | 11.1 |
| *රසායනික ද්‍රව්‍ය,තීන්ත වර්ග සහ පොහොර* | 129 | 162 | 183 | 212 | 240 | 15.9 | 13.0 |
| *රබර්* | 141 | 181 | 213 | 253 | 274 | 18.9 | 8.4 |
| *ප්ලාස්ටික් සහ පිවීසී* | 134 | 161 | 182 | 210 | 227 | 15.1 | 8.1 |
| *ඖෂධ,සනීපාරක්ෂක ද්‍රව්‍ය සහ අනෙකුත්* | 166 | 204 | 235 | 265 | 297 | 12.8 | 12.0 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 212 | 228 | 243 | 254 | 267 | 4.5 | 5.0 |
| *දියමන්ති සැකසීම* | 235 | 280 | 270 | 260 | 237 | -3.7 | -8.8 |
| *පිඟන් නිෂ්පාදන* | 143 | 158 | 181 | 189 | 195 | 4.1 | 3.4 |
| *සිමෙන්ති* | 182 | 199 | 212 | 232 | 276 | 9.4 | 18.8 |
| *ගොඩනැගිලි ද්‍රව්‍ය සහ වෙනත්* | 164 | 180 | 204 | 221 | 241 | 8.2 | 9.0 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 266 | 305 | 351 | 359 | 399 | 2.3 | 11.1 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත | 141 | 147 | 150 | 178 | 197 | 18.7 | 10.7 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 168 | 193 | 221 | 250 | 262 | 13.1 | 4.8 |
| සියළුම කාණ්ඩ | 172 | 192 | 205 | 230 | 246 | 12.1 | 6.9 |

(අ) තාවකාලික


මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## 4.2 නිෂ්පාදනය

ආයෝජන මණ්ඩලයට අයත් නොවන කර්මාන්ත 475 ක් ආවරණය වන පරිදි කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ 1998 කර්මාන්ත නිෂ්පාදන සමීක්ෂණය, රාජ්‍ය අංශයේ කාර්මික නිෂ්පාදනය සහ ආයෝජන මණ්ඩලය යටතේ ඇති කර්මාන්තවල අපනයන දත්ත පදනම් කරගත් ගණන් බැලීම් වලට අනුව 1998 වර්ෂයේ කාර්මික නිෂ්පාදනයෙහි වර්ධනය සියයට 7.5 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. සමීක්ෂණයට අනුව සමස්ත කාර්මික නිෂ්පාදනය වර්තමාන මිල ගණන් අනුව සියයට 14 කින් ඉහළ ගියේය. මේ අනුව කම්හල් නිෂ්පාදන සඳහා වන ගම්‍ය මිල දර්ශකය සියයට 6 ක් වේ. මෙයින් කර්මාන්ත අංශයේ නිෂ්පාදන පිරිවැය ඉහළ යාමක් පෙන්නුම් කෙරේ. 1998 වර්ෂයේ කර්මාන්ත අංශයේ වර්ධනය ප්‍රධාන වශයෙන් ලබාගෙන ඇත්තේ ආහාර, පාන වර්ග සහ දුම්කොළ; රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල් නිෂ්පාදිත, රබර්, සහ ප්ලාස්ටික් නිෂ්පාදිත සහ රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන යන නිෂ්පාදන කාණ්ඩවල වර්ධනය තුලිනි. මෙම කාණ්ඩ කර්මාන්ත අංශයේ වර්ධනයෙන් සියයට 86 කට දායක විය.

4.2 රූප සටහන

කාර්මික නිෂ්පාදන වටිනාකම (1990-ස්ථාවර මිල අනුව)





### පෞද්ගලික අංශයේ කර්මාන්ත

ඉකුත් වර්ෂයේ සියයට 12.1 ක්වූ පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදන වර්ධනය මෙම වර්ෂයේදී සියයට 6.9 දක්වා පහත වැටුණි. 1998 වර්ෂයේදී පෞද්ගලික අංශයේ කර්මාන්ත, මුළු කාර්මික නිෂ්පාදනයෙන් සියයට 93 කට දායක විය. පෙර වසරේදී සියයට 19 ක්වූ ආයෝජන මණ්ඩලය යටතේ පැවති කර්මාන්තවල ඇස්තමේන්තු කරන ලද වර්ධනය 1998 දී සියයට 6.4 ක් විය. පෙර වසරේදී සියයට 5.2

කින් වර්ධනය වූ ආයෝජන මණ්ඩලයට අයත් නොවන දේශීය වෙළෙඳපොළ කෙරෙහි යොමු වූ කර්මාන්ත සියයට 7.5 කින් වර්ධනය විය. පෞද්ගලික අංශයේ ආහාර, පාන වර්ග සහ දුම්කොළ; රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන; රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත සහ මූලික ලෝහ නිෂ්පාදන කාණ්ඩ වර්ධනය විය. ආයෝජන මණ්ඩලයට අයත් නොවන කාර්මාන්ත අංශයේ සේවා නියුක්තිය වසර තුළදී සියයට 2.7 කින් වර්ධනය විය. මෙම අංශයේ ධාරිතා උපයෝජනය පෙර වසරේදී මෙන්ම සියයට 84 ක් වූ අතර, ලාභදායිත්වය 1997 දී වාර්තා වූ සියයට 14.9 සිට 1998 දී සියයට 12.5 දක්වා පහත වැටුණි.

4.3 රූප සටහන
**පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදන ප්‍රමාණ දර්ශකය**
**( % වෙනස)**




## රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත

රෙදිපිළි, ඇඟළුම් හා සම් භාණ්ඩ නිෂ්පාදන අංශය 1998 වර්ෂයේදී සියයට 4.5 කින් වර්ධනය වී ඇති බවට ඇස්තමේන්තු කර ඇත. මෙම අංශය ඉකුත් වර්ෂයේදී අත්කරගත් සියයට 18.7 ක වර්ධනය සමඟ සසඳනවිට මෙය සැළකිය යුතු පහත වැටීමකි. මෙම කාණ්ඩය 1998 වර්ෂයේ දි පෞද්ගලික අංශයේ කාර්මික නිෂ්පාදන වර්ධනයට සියයට 24.4 කින් දායක විය. ඇමරිකා එක්සත් ජනපදයට යවන ලද සමහර පංගු අයිතමයන් නියමිත පංගු ප්‍රමාණයන් ඉක්මවා නැව්ගත කිරීම පංගු පරිපාලනය සම්බන්ධයෙන් සැලකිල්ලට ගතයුතු කරුණක් වූ අතර, මේ නිසා සමහර නිෂ්පාදකයින්ට ඔවුන්ගේ අපනයන කිරීම් 1999 දක්වා කල් දැමීමට සිදු විය. ඒ හේතුවෙන් වර්ෂය අවසානයේදී තොග එක්රැස් වීමක් දක්නට ලැබුණි. වර්ෂය අවසානයේ ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායයන්හි අවසාන තොගවල වටිනාකම සියයට 12 කින් ඉහළ යාමෙන් මෙය පැහැදිලි වේ. ආයෝජන මණ්ඩලය යටතට ගැනෙන රෙදිපිළි සහ ඇඟළුම් කර්මාන්ත වර්ෂය තුළදී පෙන්නුම් කළේ සියයට 4.6 ක සාමාන්‍ය වර්ධනයකි. 1998 දී ශ්‍රී ලංකාවට ලැබුණු මුළු ඇඟළුම් හා රෙදිපිළි පංගු ප්‍රමාණය සියයට 4.5 කින් ඉහළ ගියේය. පංගු උපයෝජනය 1997 වර්ෂයේදී වූ සියයට 73.6 ක සිට 1998 දී සියයට 74.1 දක්වා ඉහළ ගියේය. ආනයනය කරන ලද රෙදිපිළි සඳහා තීරු බදු අහෝසි කිරීම, රේගුවෙහි ඇති වන ප්‍රමාදවීම් සහ දේශීය වෙළෙඳපොළෙහි රෙදිපිළි මිල ඉහළ යාම අඩු කිරීමට අධාර වුවද දේශීය රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය විවෘත ආනයන තරගකාරිත්වයකට යොමු කරවීය. සමහර කර්මාන්තශාලාවල පැවැති ගැටළු සහගත තත්ත්වයන් නිෂ්පාදන කටයුතු නතර වීමට ඉවහල් වූ අතර අතිරික්ත 3,000 ක පමණ සේවා නියුක්තිකයන් ප්‍රමාණයක් (වේටෙක්ස් සහ පූගොඩ) ඉවත් කිරීමට හේතු විය. කෙසේ වුවද මෙම සේවකයින් සඳහා නොකඩවා වැටුප් ගෙවන ලදී.

1998 වර්ෂයේදී ශ්‍රී ලංකාවෙන් ඇමරිකා එක්සත් ජනපදයට අපනයනය කරන ලද රෙදිපිළි සහ ඇඟළුම් එක්සත් ජනපද මුළු අවශ්‍යතාවයෙන් සියයට 2.1 ක් වූ අතර එය ශ්‍රී ලංකාවේ මුළු රෙදිපිළි අපනයන වලින් සියයට 60 ක් විය. එක්සත් ජනපදයට කරන ලද ඇඟළුම් අපනයන, 1997 දී වර්ග මීටර් සමානුපාතික (ව.මී.ස.) දශ ලක්ෂ 322 සිට 1998 දී ව.මී.ස. දශ ලක්ෂ 333 දක්වා සියයට 3.4 කින් ඉහළ ගියේය. මෙයින් සියයට 77 ක් පංගු ක්‍රමය යටතේ කරන ලද අපනයන වේ. ඇමෙරිකා එක්සත් ජනපදයට කළ මුළු ඇඟළුම් අපනයනයන්ගේ වටිනාකම 1997 දී වූ ඇ.එ.ජ. ඩොලර් දශ ලක්ෂ 1,204 ක සිට 1998 දී ඇ.එ.ජ. ඩොලර් දශ ලක්ෂ 1,308 දක්වා සියයට 8.7 කින් ඉහළ ගියේය. ඇඟළුම් මිල ගණන්වල සියයට 5.5 ක වර්ධනයක් සිදු විය. ඇමෙරිකා එක්සත් ජනපදයට සියළුම රටවල් විසින් කරන ලද ඇඟළුම් අපනයනවල මිල ගණන් පහත වැටීම සමඟ සසඳ බලනවිට මෙය හිතකර වර්ධනයකි. මෙරට ඇඟළුම් කර්මාන්තකරුවන් වඩා ඉහළ එකතු කල වටිනාකමක් ඇති අයිතමයන් කරා මාරුවීම නිසා ඉහළ තරගකාරී වෙළෙඳපොළ තත්ත්වයන් යටතේ පවා ශ්‍රී ලංකා ඇඟළුම් සඳහා ඇමෙරිකා එක්සත් ජනපද වෙළෙඳපොළෙහි ඉහළ මිලක් ලබාගැනීමට සමත්ව ඇත. එක්සත් ජනපදයට කරනු ලැබූ අනෙකුත් රෙදිපිළි අපනයන 1997 දී ව.මී.ස. දශ ලක්ෂ 157 ක සිට 1998 දී ව.මී.ස. දශ ලක්ෂ 195 දක්වා සියයට 24 කින් වර්ධනය වී ඇත. පංගු නොවන අපනයන අයිතමයන් සියයට 25 කින් ඉහළ ගොස් ඇත.

1998 වර්ෂයේදී ලැබුණු පංගු ප්‍රමාණය සියයට 4.5 කින් ඉහළ ගියේ, එක්සත් ජනපද පංගු සියයට 3.2 කින්ද, යුරෝපා සංගමයේ පංගු සියයට 13.3 කින් සහ කැනේඩියානු පංගු සියයට 7.8 කින්ද ඉහළ යාමේ ප්‍රතිඵලයක් වශයෙනි. වර්ෂය තුළදී එක්සත් ජනපදයට යවනු ලැබූ කමිස සහ හැට්ට, රාත්‍රි ඇඳුම් සහ යට ඇඳුම්, තුවා සහ අනෙකුත් සිනිඳු තුවා, සාප්පු තුවා සහ වියන ලද රෙදි සැළකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගියේය. යුරෝපීය සංගම් වෙළෙඳපොළෙහි වියන ලද පිරිමි සහ ළමා කමිස හැර අනිකුත් පංගු ප්‍රමාණය 1998 වර්ෂයේදී ඉහළ ගියේය. වියන ලද පිරිමි සහ ළමා කමිස කාණ්ඩයේ පංගු උපයෝජන අනුපාතය සියයට 50 ට අඩුවෙන් පැවති බැවින් පංගු ප්‍රමාණය අඩු වීම මෙම ඇඟළුම් අපනයන කෙරෙහි සැලකිය යුතු ලෙස බලපෑමක්

4.3 සංඛ්‍යා සටහන
**කාර්මික නිෂ්පාදන වටිනාකම**
**(පවත්නා මිල ගණන් අනුව)**

| කාණ්ඩය | රුපියල් දශලක්ෂ | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1994 | 1995 | 1996 | 1997 | 1998 (අ) | 1997 | 1998(අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 45,054 | 54,927 | 68,209 | 75,713 | 86,994 | 11.0 | 14.9 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 80,845 | 99,602 | 112,539 | 142,249 | 160,543 | 26.4 | 12.9 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 1,601 | 1,929 | 2,171 | 2,299 | 2,511 | 5.9 | 9.2 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 4,066 | 4,595 | 5,069 | 5,462 | 5,593 | 7.8 | 2.4 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 34,017 | 38,321 | 46,936 | 50,682 | 59,724 | 8.0 | 17.8 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 14,580 | 16,740 | 18,997 | 21,403 | 23,830 | 12.7 | 11.3 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 1,909 | 1,736 | 2,248 | 2,439 | 2,841 | 8.5 | 16.5 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 7,122 | 7,977 | 8,807 | 11,327 | 13,241 | 28.6 | 16.9 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 4,083 | 5,271 | 6,183 | 7,324 | 8,137 | 18.5 | 11.1 |
| එකතුව | 193,277 | 231,098 | 271,159 | 318,898 | 363,414 | 17.6 | 14.0 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

ඇති නොකලේය. කබා, වැහි කබා, රාත්‍රී ඇඳුම්, යට ඇඳුම්, නාන ඇඳුම් හා ඇඳ ඇතිරිලි සඳහා කැනඩාවෙන් ලැබුණු පංගු ප්‍රමාණයෙහි සැලකිය යුතු ඉහළ යාමක් දක්නට ලැබුණි. කෙසේ නමුත්, 1998 වර්ෂය තුලදී කාන්තා සහ පිරිමි කබා, ගවුම් සහ කලිසම් වැනි එකතු කල අගය ඉහළ මට්ටමක ඇති රෙදිපිළි පංගුවල ප්‍රමාණවත් වර්ධනයක් දක්නට නොලැබුණි.

පංගු උපයෝජනය, පෙර වසරේදී මෙන්ම අඩු එකතු කළ වටිනාකමක් ඇති අයිතමයන්ගේ සිට ඉහළ එකතු කල අගයක් ඇති අයිතමයන් දක්වා මාරුවීමක් දක්නට ලැබුණි. එක්සත් ජනපද වෙළෙඳපොළෙහි සමහර පංගු අයිතමයන්හි එනම්, කබා, පිරිමි සහ ළමුන්ගේ සූට් නොවන කබා, කාන්තාවන්ගේ සහ පිරිමින්ගේ කබා, ඇඳුම්, ගොතන ලද කමිස සහ හැට්ට, පිරිමින්ගේ සහ ළමයින්ගේ නොගෙතූ කමිස, කලිසම් සහ මසන ලද ගවුම් වැනි අයිතමයන්හි පංගු මුළුමනින්ම උපයෝජනය කර ඇත. කැනඩා වෙළෙඳපොළේ පංගු අයිතමයන් වන ආවරණ කබා, කොට කලිසම් සහ දිග කලිසම් වල පංගු උපයෝජන අනුපාතය ඉහළ මට්ටමක පැවතිනි. 1998 දී අනෙකුත් පංගු අයිතම වලින් විශාලම ඉල්ලුමක් පැවති කාණ්ඩ වූයේ සාය, රාත්‍රී ඇඳුම්, යට ඇඳුම්, සාප්පු තුවා සහ කලිසම්ය. කොට්ට උර, අත්පිස්නා, නොගෙතූ කමිස සහ බ්ලවුස් වැනි අඩු එකතු කල වටිනාකමක් ඇති අයිතමයන්හි උපයෝජන අනුපාතය පහත මට්ටමක පැවතියේ නිෂ්පාදකයින් ඉහළ එකතු කල වටිනාකමක් ඇති අයිතමයන් කරා යොමු වූ බැවිනි. කෙසේ නමුත්, වියන ලද විවිධ වර්ගයේ උණුසුම් ඇඳුම් සඳහා පහළ උපයෝජන අනුපාතයක් පැවතියේ ශ්‍රී ලංකාවට මෙම අයිතමයන් නියමිත ගුණාත්මක බවින් යුතුව තරගකාරී මිලකට නිපදවීම සඳහා ප්‍රමාණවත් තාක්ෂණය සහ හැකියාව නොමැති නිසාවෙනි.

පංගු ක්‍රමය 2005 දී සම්පූර්ණයෙන්ම අවසන් වූ විට ජාත්‍යන්තර තරගකාරිත්වය තියුණු වීමට ඉඩ ඇත. මෙම අනාගත අභියෝගයට සාර්ථකව මුහුණ දීම පිණිස නව තාක්ෂණයෙහි ආයෝජනය කිරීම සහ පුහුණු කටයුතු වැඩි දියුණු කිරීම මගින් ඵලදායීතාවය ඉහළ නැංවිය යුතුය. වෙළෙඳපොළේ ඇති වන පාරිභෝගිකයින්ගේ රුචිය සහ මෝස්තර වෙනස්වීම්වලට ඉක්මණින් ප්‍රතිචාර දැක්වීම සඳහා දියුණු තොරතුරු හුවමාරු ක්‍රම උපකාරී වනු ඇත.

## ආහාර, පාන වර්ග සහ දුම්කොළ

සියයට 9.6 කින් වර්ධනය වූ ආහාර, පාන වර්ග සහ දුම්කොළ කර්මාන්ත කාණ්ඩය 1998 වසරෙහිදී පෞද්ගලික අංශයේ කාර්මික වර්ධනයට සියයට 28 කින් දායක විය. මෙම කාණ්ඩයෙහි ආහාර, මද්‍යසාර සහ පාන වර්ග වැනි උප කාණ්ඩ ඉහළ නිෂ්පාදන මට්ටම් වාර්තා කොට ඇත. තිරිඟු නිෂ්පාදන, කිරි නිෂ්පාදන, සත්ව ආහාර, බිස්කට්, රසකැවිලි, සීනි සහ සකස් කළ මාංශ නිෂ්පාදනයන්හි ඉහළ නිෂ්පාදන මට්ටම් පිළිබිඹු කරමින් ආහාර උප කාණ්ඩය තවදුරටත් වර්ධනය වී ඇත. සහල් මිල වැඩි වීම හා සකස් කළ ආහාර කර්මාන්ත වල වර්ධනය නිසා තිරිඟු පිටි සඳහා පැවති ඉල්ලුම වැඩි විය. ගුණාත්මක බව වැඩි කිරීම සහ වඩාත් කාර්යක්ෂම බෙදා හැරීමේ ක්‍රම අනුගමනය කිරීම කිරි නිෂ්පාදන කර්මාන්තයෙහි නිෂ්පාදන වර්ධනයට උපකාරී විය. මෙම කර්මාන්තයෙහි නියැලි ඇතැම් ප්‍රමුඛ පෙළේ නිෂ්පාදකයින් විසින් වැඩි වන ඉල්ලුම සපුරාලීම සඳහා වැඩ වාර තුනක් ක්‍රියාත්මක කරනු ලැබීය. සුළු පරිමාණ කුකුළු පාලනය රට පුරා ව්‍යාප්ත වීමෙන් සත්වාහාර සඳහා පැවැති ඉල්ලුම ඉහළ ගියේය. චොකලට්, බිස්කට්, රසකැවිලි සහ සකස් කළ මාංශ නිෂ්පාදකයින් විසින් අළුතින් හඳුන්වා දුන් නිෂ්පාදනවලට යහපත් පාරිභෝගික ප්‍රතිචාරයක් ලැබුණි. සාර්ථක ප්‍රචාරණ ක්‍රම සහ දියුණු කරන ලද ඇසුරුම් මෙම නිෂ්පාදනවල ඉල්ලුම ඉහළ නැංවීමට ඉවහල් විය. 1998 වර්ෂය තුල ධාරිතා ප්‍රසාරණය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මද්‍යසාර නිෂ්පාදනය සියයට 9 කින් වැඩි විය.

1998 වසර තුල බීර කර්මාන්තයෙහි වූ ධාරිතා ප්‍රසාරණය වැඩි වන බීර ඉල්ලුම සාර්ථක ලෙස සපුරාලීමට සමත් විය. වසර තුල දී අළුත් බීර වර්ග කීපයක්ම හඳුන්වා දෙනු ලැබීය. බීර මිල ගණන් වසර තුලදී ඉහළ ගියද එමගින් බීර ඉල්ලුමට සැලකිය යුතු බලපෑමක් ඇති නොවීය. ශ්‍රී ලංකාවේ බීර පරිභෝජනය මුළු මද්‍යසාර පරිභෝජනයෙන් සියයට 10 කට වඩා අඩු වන අතර, සංවර්ධිත රටවල මෙම අනුපාතය සියයට 80 ක් පමණ වේ. එබැවින් බීර කර්මාන්තය දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාව තුල තවමත් ප්‍රයෝජනයට නොගත් වෙළෙඳපොළ ශක්‍යතාවයන් පවතී. බීර සඳහා පවතින සිල්ලර වෙළඳ ජාලය ව්‍යාප්ත කිරීම සඳහා වැඩි බලපත්‍ර ප්‍රමාණයක් ලබා දීම තුලින් කර්මාන්තයේ වර්ධනයට පිටුවහලක් ලබා දිය හැකිය.

තේ සැකසුම් සහ සිසිල් බීම කර්මාන්තයෙහි වර්ධනය පිළිබිඹු කරමින් පාන වර්ග උප කාණ්ඩය සියයට 9 කින් වැඩි වී ඇත. විශේෂයෙන්ම වසරේ මුල් භාගය තුල පැවැති ආකර්ශණීය මිල ගණන් තේ සැකසුම් කර්මාන්තය සඳහා වාසිදයක විය. සිසිල් බීම නිෂ්පාදනය සියයට 29 කින් වර්ධනය විය. ප්‍රබල ප්‍රචාරණ ක්‍රම, නව නිෂ්පාදන හඳුන්වා දීම සහ භාණ්ඩ ඇසුරුම් ක්‍රම වර්ධනය වීම ඉල්ලුම ඉහළ යාමට හේතු වී ඇත. මෙම කර්මාන්තයෙහිද නිෂ්පාදන ඵලදයීතාව හා බෙද හැරීමේ කටයුතුවල වර්ධනයක් දක්නට ලැබුණි. ශීතකරන පහසුකම් වැඩි දියුණු කිරීම සහ යොදවන ලද වාහන සංඛ්‍යාව ඉහළ නැංවීම මගින් බෙද හැරීම් ජාලය ශක්තිමත් විය. වර්ෂය තුල පැවැති යහපත් කාලගුණික තත්ත්වය හේතුකොටගෙන පළතුරු වැඩි ප්‍රමාණයක් ලබා ගත හැකි වීම, පළතුරු සැකසුම් කර්මාන්තයේ සාර්ථකත්වයට හේතු විය. නව තාක්ෂණ ක්‍රම හඳුන්වා දීම සහ නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම නිසා අපනයන වෙළෙඳපොළ සඳහා නිපදවන කෝඩියල්, ටින් කළ පළතුරු සහ ජෑම් නිෂ්පාදනය 1998 වර්ෂයේදී ඉහළ ගියේය. කෙසේ වුවද, ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොතිබීම, වාණිජමය වගාවන් අඩු වීම, ඉහළ ඵලදයීතාවක් ඇති හොඳ බීජ හිඟය සහ කෘෂිකර්මාන්තය සහ කර්මාන්ත අංශය අතර කිට්ටු සබඳතාවයක් නොමැති වීම හේතුකොටගෙන පළතුරු සැකසුම් කර්මාන්තය දියුණු කිරීමට ඇති හැකියාවෙන් නිසි ඵල ලබා නොමැත. දුම්කොළ සැකසුම් කර්මාන්තයේ පැවති මන්දගාමී බව නොකඩවා දෙවන වසරටද දක්නට ලැබුණි. නීතිවිරෝධී ලෙස ආනයනය කරනු ලබන සිගරට් මෙම කර්මාන්තය සඳහා පවතින ප්‍රධානතම තර්ජනය වේ. දුම්කොළ නිෂ්පාදන ප්‍රචාරණයට නීතිමය බාධා පැවතීම හා දුම් බීම ආශ්‍රිත සෞඛ්‍ය ගැටළු පිළිබඳ විශාල වශයෙන් දැනුවත් වීම විශේෂයෙන් තරුණ පරපුර සිගරට් සඳහා කරන ඉල්ලුම පහත වැටීමට හේතු විය. සිගරට් අලෙවිය සියයට 3.7 කින් පහත වැටුණු අතර, නිෂ්පාදනය සියයට 1.5 කින් පහත වැටුණි.

## රසායන, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන

1998 වසර තුලදී සියයට 11 ක නිෂ්පාදන වර්ධනයක් වාර්තා කරමින් රසායන ද්‍රව්‍ය, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කර්මාන්තය අඛන්ඩ වර්ධනයක් පෙන්වීය. මෙම කාණ්ඩයට ඇතුලත් වන ආයෝජන මණ්ඩලය යටතේ පවතින කර්මාන්තවල මෙන්ම දේශීය වෙළෙඳපොළ වෙත යොමු වූ කර්මාන්තවලද සැළකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. දේශීය ඖෂධ වර්ගවල උසස් ගුණාත්මක බව සහ අඩු මිල ගණන් එම කර්මාන්තය ආනයන භාණ්ඩ සමඟ තරඟකාරිත්වයකට පත්වීමට උපකාර විය. ගුණාත්මක බව වර්ධනය වීම, වඩාත් හොඳ ඇසුරුම් සහ තරඟකාරී ප්‍රචාරණ කටයුතු නිසා විෂබීජ නාශක, සබන්, සුවඳ විලවුන් සහ දත් බෙහෙත් වැනි පාරිභෝගික නිෂ්පාදනයන් සඳහා ඉල්ලුම වැඩි විය.

1998 වසර තුල ඉදි කිරීමේ කටයුතු පුළුල් වීම නිසා, තීන්ත වර්ග, වාර්නිෂ්, පී.වී.සී. සහ රසායන නිෂ්පාදන සඳහා පැවති ඉල්ලුම ඉහළ ගියේය. වෙනත් දියුණු වෙමින් පවත්නා කර්මාන්ත හා වෙළඳ කටයුතු සඳහා අවශ්‍ය ඇසුරුම් ද්‍රව්‍ය සැපයීමෙන් ප්ලාස්ටික් කර්මාන්තය වෙනත් කර්මාන්ත සඳහා ආධාරක කර්මාන්තයක් ලෙස වර්ධනය විය. මීට අමතරව දේශීය ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ නිෂ්පාදනයද, 1998 වර්ෂයේදී ඉහළ ගියේය. ආයුර්වේද ඖෂධ සඳහා පැවති ඉල්ලුමද වර්ෂය තුලදී අඛණ්ඩ වර්ධනයක් පෙන්වීය.


## වෙනත් නිෂ්පාදන

සකස් කළ ලෝහ භාණ්ඩ නිෂ්පාදන කාණ්ඩය සියයට 11 කින් වර්ධනය වීය. ප්‍රධාන ගැණුම් කරුවන් සමඟ පවත්වාගෙන ගිය ශක්තිමත් වෙළෙඳ සබඳතා නිසා ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි පැවැති මිල තරගය හමුවේ වුවද ආයෝජන මණ්ඩල නිෂ්පාදකයින්ට බටහිර වෙළෙඳපොළ තුල තම නිෂ්පාදන අලෙවි කර ගැනීමට හැකි වී ඇත. ගෘහ භාණ්ඩ සහ ලුහු ඉංජිනේරු භාණ්ඩ නිෂ්පාදනය වැනි දේශීය වෙළෙඳපොළ වෙත යොමු වූ කර්මාන්ත 1998 වසර තුල තවදුරටත් වර්ධනය විය. දැව සැපයුම අඩු වීම සහ දැව මිල ගණන් ඉහළ යාම නිසා දැව භාණ්ඩ සඳහා වානේ ගෘහ භාණ්ඩ ආදේශනය ඉහළ ගියේය. අඩු මිල ගණන්, කල්පැවැත්ම සහ සිත් ගන්නා පෙනුමක් ඇති බැවින් දොර හා ජනෙල් රාමු සහ වෙන් කිරීමේ කටයුතු සඳහා දැව වෙනුවට ඇළුමිනියම් යොද ගැනීමේ ප්‍රවනතාවයෙහි වැඩි වීමක් දක්නට ලැබුණි. 1998 වසර තුල ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදන සියයට 9 කින් වැඩි වී ඇත. ඉදි කිරීම් කටයුතු ඉහළ යෑමත් සමඟ විදුලි භාණ්ඩ හා කේබල් සඳහා ඉල්ලුමද වැඩි විය. ආරක්ෂක කටයුතු සඳහා රජයේ ඇණවුම් ඉහළ යාම හේතුකොටගෙන 1998 වසර තුලදීද බෝට්ටු නිෂ්පාදනයෙහි හා බෝට්ටු අළුත්වැඩියා කිරීමේ කටයුතු වල අඛන්ඩ වැඩි වීමක් දක්නට ලැබුණි. කෙසේ වුවද, ආනයන තරඟකාරිත්වය හමුවේ ඉකුත් වසරේදී මෙන්ම මගී ප්‍රවාහන රථ හා ලොරි බොඩි සැකසුම හා විදුලි බුබුළු නිෂ්පාදනයද පහත වැටී ඇත.

1997 වසරෙහිදී අත්කරගත් සියයට 4.4 ක වර්ධනයට සාපේක්ෂව ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන 1998 දී සියයට 5.0 කින් වර්ධනය විය. දියමන්ති, මැණික් හා දියමන්ති ඔබ්බන ලද ස්වර්ණාභරණ සහ ඇතැම් පිඟන් භාණ්ඩ සඳහා

ආසියානු පැසිපික් කලාපයෙහි ඉල්ලුම පහළ මට්ටමක පැවැති බැවින් මෙම භාණ්ඩ නිෂ්පාදනය තවදුරටත් අඩු විය. 1998 වසර තුල සිමෙන්ති, කොන්ක්‍රීට් නිෂ්පාදන, මැටි භාණ්ඩ නිෂ්පාදන, පිඟන් භාණ්ඩ නිෂ්පාදන, ඇස්බැස්ටෝස් සහ සෙවිලි හා සීලිං තහඩු නිෂ්පාදනය ඉහළ ගියේය. 1998 වර්ෂයේදී සිමෙන්ති කර්මාන්තයේ නිෂ්පාදන ධාරිතාවය වර්ධනය විය. ඉදි කිරීම් කර්මාන්තයේ වර්ධනය නිසා ඇස්බැස්ටෝස්, කොන්ක්‍රීට් නිෂ්පාදන හා බිත්ති සහ පොළොව අතුරණ පිඟන් ගඩොල්, සනීපාරක්ෂක භාණ්ඩ හා විදුලි රැහැන් ආවරණ සඳහා ඉල්ලුම ඉහළ ගියේය. අළුත් යන්ත්‍ර හඳුන්වා දීම නිසා පිඟන් නිෂ්පාදන කර්මාන්තයෙහි ඵලදායීතාව වර්ධනය විය. අළෙවි ප්‍රවර්ධන කටයුතු පුළුල් වීම නිසා පිඟන් ගඩොල්වල දේශීය අලෙවිය ඉහළ ගියේය. ශ්‍රී ලංකාව විසින් දැනට සපයනු ලබන්නේ ලෝක වෙළෙඳපොළ පිඟන් ගඩොල් අවශ්‍යතාවයන්ගෙන් සියයට 2 කටත් අඩු ප්‍රමාණයකි. මෙම කර්මාන්තයට සැලකිය යුතු ලෙස වර්ධනය වීමේ හැකියාවක් ඇති අතර දියුණු වෙමින් පවත්නා තරගකාරී වෙළඳපොළ අවශ්‍යතාවයන් සපුරාගනිමින් ලෝක වෙළඳපොළෙහි ශ්‍රී ලංකාව සතු වෙළෙඳපොළ කොටස වර්ධනය කරගැනීමට උත්සාහ කළ යුතුය.

මුද්‍රිත ද්‍රව්‍ය, ලේබල්, අභ්‍යාස පොත් සහ දින දර්ශන, පුවත් පත් සහ නව සඟරා සඳහා ඉල්ලුම වැඩිවීම හේතුකොටගෙන කඩදාසි සහ කඩදාසි නිෂ්පාදනවල සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. වෙනත් කර්මාන්තවල සිදු වූ ව්‍යාප්තිය හේතුවෙන් ලේබල්, රැළි සහිත ඝණ කඩදාසි සහ කඩදාසි පෙට්ටි සඳහා ඉල්ලුම වැඩි විය. ආනයන සැපයුම ඉහළ ගොස් තිබුනද, උසස් ගුණාත්මක බව මෙන්ම ආනයනය කරන ලද පොත්වල මිල ගණන් වලට සාපේක්‍ෂව මිල අඩුවීමද හේතුකොටගෙන අභ්‍යාස පොත් නිෂ්පාදනය ඉහළ ගියේය. 1996 වසරෙහිදී දැව ආනයන බදු මුළුමනින් ඉවත් කළද, දැව සහ දැව නිෂ්පාදන කාණ්ඩය 1998 වර්ෂය තුලදී සුළු වශයෙන් පහත වැටීමක් පෙන්නුම් කළේය. දැව නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි පැවති දැඩි තරගකාරිත්වය හේතුවෙන් අපනයන වෙළෙඳපොළ අරමුණු කොට ගත් නිෂ්පාදකයින්ට මෙම ප්‍රතිපත්තිය මගින් ලබා ගැනීමට හැකිව තිබූ පූර්ණ ඵල නෙලාගත නොහැකි විය.




වර්ෂය තුල දේශීය වෙළෙඳපොළ සඳහා වූ දැව නිෂ්පාදන කර්මාන්තයෙහි මධ්‍යස්ථ වර්ධනයක් සනිටුහන් කළද, දේශීය දැව සැපයුමෙහි හිඟය මෙම කර්මාන්තයෙහි වර්ධන හැකියාව වැඩිකිරීමෙහිලා දැඩි බාධකයක්ව පැවතිණ.

## රාජ්‍ය අංශයේ කර්මාන්ත

1997 වර්ෂයේ සියයට 15 ක පසුබැමට ලක් වූ රාජ්‍ය අංශයේ කාර්මික නිෂ්පාදිතය 1998 දී සියයට 16 කින් වර්ධනය වී ඇත. රාජ්‍ය අංශයේ කාර්මික නිෂ්පාදිතයෙන් සියයට 90 කට වැඩි ප්‍රමාණයකට දායකත්වය සපයන ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙහි ඉහළ ක්‍රියාකාරිත්වය තුලින් මෙම ඉහළ වර්ධනය පිළිබිඹු වේ. 1998 වසර තුල අඛණ්ඩව ඛනිජ තෙල් පිරිපහදුව ක්‍රියා කරවීමට හැකි වීම, ඛනිජ තෙල් සංස්ථාවෙහි නිෂ්පාදිතය සියයට 18 කින් වැඩි වීමට හේතු විය. සීමාසහිත ලංකා ලුණු සමාගම සහ සීමාසහිත ජාතික කඩදාසි සමාගම හැර සෙසු රාජ්‍ය අංශයේ ව්‍යවසායයන් වර්ෂය තුල ඉහළ නිෂ්පාදන අගයන් වාර්තා කර ඇත. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන ඉහළම වර්ධනය (සියයට 30) වාර්තා කොට ඇති අතර, දැව සහ දැව නිෂ්පාදන (සියයට 23); රසායන, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන (සියයට 18) සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ (සියයට 5) නිෂ්පාදන වර්ධනයන් වාර්තා කර ඇත. කෙසේ වුවද, රාජ්‍ය අංශයේ කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන සියයට 23 ක පහත වැටීමක් පෙන්වා ඇත.

1997 වර්ෂයේ රබර් වගා කරන ප්‍රදේශවල රබර් කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීමත් සමඟ සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවට අමු රබර් කිරි වැඩි ප්‍රමාණයක් මිලදී ගැනීමට හැකි වීම නිසා 1998 වසරේදී සියයට 10 ක නිෂ්පාදන වර්ධනයක් ලබාගත හැකි විය. රාජ්‍ය දැව සංස්ථාවෙහි නිෂ්පාදනය සියයට 23 කින් වැඩි වී ඇත. වන සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව වසර තුල ගස් කැපීමේ කටයුතු සඳහා වැඩි කැලෑ ඉඩම් ප්‍රමාණයක් වෙන් කර දී ඇත. උක් දඬු සැපයුමෙහි වැඩි වීම හේතුවෙන් සීමාසහිත සෙවනගල සීනි කර්මාන්ත ආයතනයෙහි නිෂ්පාදනය සියයට 16 කින් වැඩි විය. සෙවනගල සීනි කම්හල විසින් උක් දඬු කපා ගන්නා ලද බිම් ප්‍රමාණය 1997 දී පැවැති හෙක්ටයාර 2,377 සිට 1998 දී හෙක්ටයාර 2,422 දක්වා වැඩි වී ඇති අතර අඹරන ලද උක් දඬු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 169,000 සිට මෙට්‍රික් ටොන් 197,000 දක්වා වැඩි වී ඇත. පසුගිය වසර තුල නැගෙනහිර ප්‍රදේශයේ ආරක්‍ෂක කටයුතු පිළිබඳ ගැටළු පැන නැගීම නිසා නිෂ්පාදන කටයුතු මාස හතකට වැඩි කාලයක් නවතා තැබීමට සිදු වුවද මෙම වසරේ වඩාත් වැඩි ගබඩා පහසුකම් ලබාගත හැකි වීමෙන් සීමාසහිත ලංකා ඛනිජවැලි සමාගමෙහි නිෂ්පාදනය සියයට 51 කින් වැඩි විය. විශේෂයෙන්ම දේශීය කෘෂි අංශයෙන් කෙරෙන ඉල්ලුම ඉහළ යෑම හේතුකොටගෙන ලංකා පොස්පේට් සමාගමෙහි නිෂ්පාදනය සියයට 24 කින් වැඩි විය.

1998 වසර තුල පැවැති අහිතකර කාලගුණික තත්ත්වය නිසා සීමාසහිත ලංකා ලුණු සමාගමෙහි නිෂ්පාදනය සියයට

**4.4 සංඛ්‍යා සටහන**
**රාජ්‍ය අංශයේ ප්‍රධාන කර්මාන්ත නිමැවුම් දර්ශකය**

1977 = 100

| කාණ්ඩය | දර්ශකය | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1994 | 1995 | 1996 | 1997 | 1998 (අ) | 1997 | 1998(අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 9.3 | 10.2 | 9.2 | 8.6 | 9.4 | -6.2 | 9.0 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | - | - | - | - | - | - | - |
| 3. දව හා දව නිෂ්පාදිත | 22.0 | 26.3 | 31.7 | 34.0 | 41.7 | 7.4 | 22.8 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 187.8 | 173.2 | 152.2 | 136.2 | 104.4 | -10.5 | -23.4 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 126.3 | 118.0 | 132.0 | 116.8 | 137.7 | -11.5 | 17.9 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 134.2 | 124.2 | 138.9 | 122.8 | 144.8 | -11.6 | 17.9 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 5.5 | 5.9 | 6.8 | 4.7 | 6.0 | -31.7 | 29.6 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 130.8 | 95.0 | 116.5 | - | - | - | - |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | - | - | - | - | - | - | - |
| සියළුම කාණ්ඩ | 83.8 | 78.0 | 86.2 | 72.2 | 83.5 | -16.3 | 15.6 |
| ඛණිජ තෙල් නිෂ්පාදිත හැර | 27.7 | 24.5 | 25.1 | 13.5 | 12.2 | -46.4 | -9.7 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව


22 කින් පහත වැටුනි. වාලච්චේනයි කම්හලෙහි විදුලිය සැපයුමට බාධා ඇති වීම නිසා සහ ඇඹිලිපිටිය කම්හලෙහි යන්ත්‍ර ක්‍රියාකාරිත්වය නිතර අඩාල වීම හේතුකොටගෙන ජාතික කඩදාසි සමාගමෙහි නිෂ්පාදනය සියයට 23 කින් පහත වැටුනි.

## 4.3 එකතු කළ අගය සහ ධාරිතා උපයෝජනය

ප්‍රධාන වශයෙන්ම ආනයනික අමු ද්‍රව්‍ය පිරිවැය පහත වැටීම නිසා 1998 වසරේදී කාර්මික අංශයෙහි එකතු කළ අගය නාමික වශයෙන් සියයට 15.4 කින් වැඩි වී ඇත. වසර තුල එකතු කළ අගයෙහි මූර්ත වටිනාකමෙහි වැඩිවීම සියයට 7.5කි. එකතු කළ වටිනාකම මුළු නිෂ්පාදන වටිනාකමෙහි ප්‍රතිශතයක් ලෙස ආන්තික වශයෙන් සියයට 37.5 දක්වා 1998 දී ඉහළ ගියේය. දව හා දව නිෂ්පාදන, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන සහ සකස් කළ ලෝහ නිෂ්පාදනවල එකතු කළ වටිනාකම් අනුපාතය සියයට 50 කට වඩා වැඩි විය. මෙම වැඩිවීම රසායන, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයෙහි සියයට 24 ක් වූ අතර මූලික ලෝහ නිෂ්පාදන කාණ්ඩයෙහි සියයට 25 ක් විය. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන; කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන හා වෙනත් කාර්මික නිෂ්පාදනයන්හි එකතු කළ අගය සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී. රෙදිපිළි, ඇඟළුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදනයන්හි දේශීය එකතු කළ අගය සියයට 34 ක් විය. මෙය ඉකුත් වසර පහේ දීම නොකඩවා වැඩි වෙමින් පැවතිනි.

1998 වර්ෂයේදී ආයෝජන මණ්ඩලය යටතේ නොවන කාර්මික අංශයෙහි ස්ථාපිත ධාරිතාව සියයට 4.0 කින් තවදුරටත් ප්‍රසාරණය විය. උසස් තාක්ෂණය දිරි ගැන්වීමේ වැඩපිළිවෙල යටතේ යන්ත්‍ර සහ උපකරණ සඳහා ආනයන බදු ඉවත් කිරීමෙන් ලත් වාසිය සහ යන්ත්‍ර සහ උපකරණ ආනයනය කිරිමේදී අඩු ජාතික ආරක්ෂක බදු ප්‍රමාණයක්

**4.5 රූප සටහන**
**කාර්මික නිෂ්පාදනයෙහි එකතු කළ වටිනාකම් ප්‍රතිශතය**




අය කිරිමේ (සියයට 0.5) ප්‍රතිපත්තිය තවදුරටත් පවත්වාගෙන යාම ප්‍රයෝජනයට ගනිමින් ආයෝජන මණ්ඩලය යටතේ නොවන කර්මාන්ත විසින් යන්ත්‍රෝපකරණ සැළකිය යුතු ප්‍රමාණයක් ආනයනය කර ඇත. ඉකුත් වසරෙහිදී මෙන්ම ඉහළම ධාරිතා ප්‍රසාරණය (සියයට 5.5) රෙදිපිළි, ඇඟළුම්

**4.5 සංඛ්‍යා සටහන**
**කර්මාන්ත අංශයේ එකතු වූ අගය**
**(පවත්නා මිල ගණන් අනුව)**

| කාණ්ඩය | රුපියල් දශලක්ෂ | | | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | 1994 | 1995 | 1996 | 1997 | 1998 (අ) | 1997 | 1998(අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 24,373 | 29,507 | 32,891 | 35,585 | 40,452 | 8.2 | 13.7 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 20,660 | 24,859 | 31,184 | 40,714 | 47,494 | 30.6 | 16.7 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 1,081 | 1,177 | 1,250 | 1,257 | 1,312 | 0.6 | 4.4 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 2,301 | 2,458 | 2,580 | 2,633 | 2,578 | 2.1 | -2.1 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 5,758 | 6,898 | 8,957 | 10,745 | 14,274 | 20.0 | 32.8 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 9,272 | 9,726 | 10,537 | 11,600 | 12,463 | 10.1 | 7.4 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 356 | 347 | 450 | 598 | 710 | 32.9 | 18.7 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 4,344 | 4,547 | 4,809 | 5,924 | 6,779 | 23.2 | 14.4 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 1,838 | 2,319 | 2,763 | 3,157 | 3,426 | 14.3 | 8.5 |
| එකතුව | 69,983 | 81,838 | 95,421 | 112,213 | 129,488 | 17.6 | 15.4 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සහ සම් භාණ්ඩ නිෂ්පාදන උප කාණ්ඩයන්හි වාර්තා විය. ධාරිතාව වර්ධනය වූ ප්‍රධාන කාර්මික කාණ්ඩයන් වූයේ ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන (සියයට 3.9); කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන (සියයට 4.3); රසායන, ඛනිජ තෙල් සහ ප්ලාස්ටික් නිෂ්පාදන (සියයට 2.8); ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන (සියයට 2.3) සහ මූලික ලෝහ නිෂ්පාදන (සියයට 3.1)ය. 1998 වසර තුළදී ද කාර්මික අංශයෙහි සමස්ත ධාරිතා උපයෝජන අනුපාතය සියයට 84 ක් ලෙස නොවෙනස්ව පැවතින.

## 4.4 නිෂ්පාදන පිරිවැය, ලාභදායිත්වය සහ සේවා නියුක්තිය

ආයෝජන මණ්ඩලය යටතට නොගැනෙන කාර්මික අංශයෙහි 1997 වසර තුළදී පැවැති සියයට 14.9 ක් වූ සාමාන්‍ය ලාභ අනුපාතය (ලාභය කාර්මික නිෂ්පාදන වටිනාකම් වල ප්‍රතිශතයක් ලෙස ගත් කළ) 1998 වසරෙහිදී සියයට 12.5 දක්වා අඩු වී ඇත. නිෂ්පාදන පිරිවැය ඉහළ නැගීම සහ නිෂ්පාදන මිල ගණන් එතරම් වැඩි නොවීම හෝ මිල ගණන් පහත වැටීම මෙයට හේතු විය. මූර්ත වශයෙන් ගත් කළ වැටුප්, බලශක්ති, අමු ද්‍රව්‍ය සහ වෙනත් පිරිවැය 1998 වසර තුළදී වැඩි විය. ආනයනය කරන ලද අමු ද්‍රව්‍ය පිරිවැය, මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස, 1997 වර්ෂයේදී පැවති සියයට 43.0 ක සිට 1998 දී සියයට 42.5 දක්වා සුළු වශයෙන් පහත වැටුණි. බොහෝ අපනයනකරුවන් ඔවුන්ගේ අපනයන ඇනවුම් නොවෙනස්ව රඳවා ගැනීම සඳහා ඉහළ වට්ටම් පිරිනමා ඇත. භාණ්ඩ හා සේවා බද්ද පැනවීමෙන් පසුව විදුලිබල පිරිවැය ඉහළ යාමද කාර්මික අශයේ ලාභදායිත්වයට බලපා ඇත. වසර තුළදී කාර්මික කාණ්ඩ බොහොමයක ලාභදායිත්වය පහත

**4.6 සංඛ්‍යා සටහන**
**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිමැවුම් ලාභය (අ)**

| කාණ්ඩය | මුළු නිෂ්පාදන පිරිවැය (රු.ද.ල.) | | මුළු නිෂ්පාදන වටිනාකම (රු.ද.ල.) | | කම්හල් ලාභ අනුපාත (ප්‍රතිශතය) | |
|---|---|---|---|---|---|---|
| | 1997 | 1998 | 1997 | 1998 | 1997 | 1998 |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 45,713 | 52,611 | 52,604 | 59,180 | 13.1 | 11.1 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 14,571 | 17,329 | 19,147 | 21,866 | 23.9 | 20.7 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 881 | 977 | 1,011 | 1,097 | 12.9 | 10.9 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 3,080 | 3,372 | 3,457 | 3,810 | 10.9 | 11.5 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 13,078 | 15,377 | 14,828 | 17,067 | 11.8 | 9.9 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 8,903 | 12,043 | 10,450 | 13,292 | 14.8 | 9.4 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 1,035 | 1,221 | 1,192 | 1,389 | 13.2 | 12.1 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 7,070 | 7,648 | 8,230 | 8,740 | 14.1 | 12.5 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 2,867 | 3,285 | 3,240 | 3,642 | 11.5 | 9.8 |
| එකතුව | 97,198 | 113,863 | 114,159 | 130,083 | 14.9 | 12.5 |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන ආයතන 475 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**4.7 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන කර්මාන්තවල දේශීය පිරිවැය ව්‍යුහය (අ)**
**(මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස)**

| කාණ්ඩය | දේශීය පිරිවැය (ප්‍රතිශතයන්) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | බලය සහ ඉන්ධන | | වැටුප් | | අමුද්‍රව්‍ය | | පොලිය | |
| | 1997 | 1998 | 1997 | 1998 | 1997 | 1998 | 1997 | 1998 |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 2.5 | 2.7 | 9.3 | 9.0 | 41.3 | 41.0 | 2.1 | 1.7 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 4.6 | 4.6 | 16.7 | 16.2 | 15.4 | 16.7 | 2.8 | 2.1 |
| 3. දව හා දව නිෂ්පාදිත | 8.1 | 8.4 | 17.9 | 18.1 | 36.6 | 37.9 | 4.9 | 3.9 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 2.0 | 2.1 | 12.4 | 12.4 | 14.1 | 13.8 | 5.1 | 4.7 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 3.9 | 4.1 | 12.4 | 12.5 | 31.5 | 29.7 | 3.9 | 3.3 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 16.4 | 16.1 | 16.1 | 15.4 | 20.1 | 20.8 | 4.4 | 4.4 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 7.8 | 7.9 | 10.1 | 10.8 | 34.6 | 33.9 | 4.2 | 3.8 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 2.8 | 3.1 | 9.8 | 10.5 | 22.3 | 21.9 | 4.1 | 3.8 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 4.7 | 4.8 | 12.5 | 11.9 | 38.2 | 39.1 | 3.2 | 2.0 |
| එකතුව | 4.5 | 4.7 | 11.8 | 11.6 | 31.7 | 31.4 | 3.0 | 2.5 |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන ආයතන 475 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.


මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

වැටුණි. ඉහල නිෂ්පාදන වියදම් මධ්‍යයේ වුවද කාර්මික කාණ්ඩ කිහිපයක ශ්‍රම ඵලදායිතාවය ඉහල යාම කාර්මික අංශයෙහි ලාභදායිත්වය විශාලවශයෙන් පහත වැටීම වලකාලීමට සමත් විය. ඉහළම ලාභදායිත්වය වාර්තා කළ රෙදිපිළි, ඇඟළුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදන කාණ්ඩයෙහි ලාභදායිත්වය ඉකුත් වසරේදී වූ සියයට 23.9 හි සිට 1998 දී සියයට 20.7 දක්වා සුළු අඩුවීමක් වාර්තා කර ඇත. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන කාණ්ඩයෙහි ලාභදායීත්වය 1997 දී වූ සියයට 14.8 හි සිට 1998 දී සියයට 9.4 දක්වා අඩු විය. 1998 වසර තුල කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන කාණ්ඩයෙහි පිරිවැය පහත වැටීම නිසා ලාභදායිත්වය 1997 දී පැවැති සියයට 10.9 හි සිට 1998 දී සියයට 11.5 දක්වා වැඩි විය.

ශ්‍රම පිරිවැය මුළු පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස ගත් කළ 1997 දී සියයට 11.8 ක් වූ අතර, 1998 දී එය සියයට 11.6 ක් දක්වා සුළු වශයෙන් පහත වැටී ඇත. බලශක්ති පිරිවැය ප්‍රතිශතය 1997 දී පැවැති සියයට 4.5 සිට 1998 දී සියයට 4.7 දක්වා වැඩි විය. කාර්මික අංශය තුල බලශක්ති පරිභෝජනය ඉහළ යාම සහ ඉහළ විදුලිය ඒකක පිරිවැය හේතුවෙන් වසර තුල බලශක්ති පිරිවැයෙහි නාමික අගය සියයට 24.2 කින් වැඩි විය. බලශක්ති පිරිවැය, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන, දව සහ දව නිෂ්පාදන සහ මූලික ලෝහ නිෂ්පාදන යන කාණ්ඩයන්හි මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රධාන ස්ථානයක් දරයි. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන හා කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන යන කාණ්ඩයන්හි බලශක්ති පිරිවැය මුළු නිෂ්පාදන පිරිවැයෙහි අඩු ප්‍රතිශතයක් වේ. මුළු නිෂ්පාදන පිරිවැය තුල පොළී පිරිවැය 1997 දී වූ සියයට 3.0 සිට 1998 දී සියයට 2.5 දක්වා සුළු වශයෙන් පහත වැටී ඇත. කෙසේ වුවද, ඇතැම් සමාගම් නව ව්‍යාපෘතීන්හි ප්‍රාග්ධන ආයෝජනය සඳහා

**4.6 රූප සටහන**

**කාර්මික නිෂ්පාදනයෙහි ශ්‍රම ඵලදායිතාවය (1995 - 100)**




1. ආහාර පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදිත
2. රෙදිපිළි, ඇඟළුම් හා සම් නිෂ්පාදිත
3. දව හා දව නිෂ්පාදිත
4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත
5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත
6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත
7. මූලික ලෝහ නිෂ්පාදිත
8. සකස් කළ ලෝහ නිෂ්පාදිත
9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත
10. සමස්ත දර්ශකය

සාපෙක්ෂ වශයෙන් ඉහළ පිරිවැයක් දරා ඇති අතර, මුළු නිෂ්පාදන පිරිවැය තුල එම සමාගම් වල පොලි පිරිවැයෙහි ප්‍රතිශතය ඉහළ මට්ටමක පැවැතුණි.

## කර්මාන්තයන්හි ශ්‍රම ඵලදායිතාවය

ශ්‍රී ලංකා මහ බැංකුවේ කර්මාන්ත නිෂ්පාදන සමීක්ෂණයට අනුව ශ්‍රම ඵලදායීතාවය සියයට 4.1 කින් වර්ධනය වී ඇත. ප්‍රධාන කාර්මික කාණ්ඩ සියල්ල තුලම මෙම වැඩි වීම දක්නට ලැබේ. ශ්‍රම ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර 1998 දී ගනු ලැබීය. සේවකයින් සඳහා නිපුණතා වර්ධන වැඩසටහන්, යන්ත්‍රසූත්‍ර වල වැඩි දියුණු කිරීම, වඩාත් යහපත් සේවා තත්ත්වයන් සහ ඉහළ කළමණාකාරිත්වය ශ්‍රම ඵලදායීතා වර්ධනයට දායක වී ඇත. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන (සියයට 5.3), රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන (සියයට 3.7), ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන (සියයට 5.0) හා කඩදසි සහ කඩදසි නිෂ්පාදන (සියයට 3.1) යන කාර්මික කාණ්ඩයන්හි ශ්‍රම ඵලදායිතාව වැඩි වී ඇත.

## කාර්මික සේවා නියුක්තිය

ආයෝජන මණ්ඩලය යටතේ සහ ආයෝජන මණ්ඩලය යටතේ නොවන කර්මාන්තයන්හි ශ්‍රම උපයෝජනයෙහි වර්ධනයක් පිළිබිඹු කරමින් 1998 වසර තුල කාර්මික අංශයේ සේවා නියුක්තිය සියයට 10.5 කින් වැඩි වී ඇත. ආයෝජන මණ්ඩල කර්මාන්තයන්හි සේවා නියුක්තිය සියයට 14.0 කින් වැඩි වූ අතර ආයෝජන මණ්ඩලයේ නොවන අංශයෙහි සියයට 2.7 කින් වැඩි වී ඇත. ආයෝජන මණ්ඩල මූලාශ්‍ර වලට අනුව අපනයන සැකසුම් කලාපයන්හි පුහුණු ශ්‍රමිකයින් සඳහා සේවා අවස්ථා තිබුණද, අවශ්‍ය නිපුණතා සහිත සේවකයින්ගේ හිඟය නිසා ඒවා සපුරාලිය නොහැකි විය. ඇතැම් කර්මාන්ත ආයතන නිෂ්පාදනයට හානියක් නොවන පරිදි සිය අනියම් සේවක සංඛ්‍යාව අඩු කර ගැනීමට සමත් විය. ප්‍රාග්ධන සූක්ෂම නව තාක්ෂණයද සේවක සංඛ්‍යාව

**4.8 සංඛ්‍යා සටහන**

**ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල ශ්‍රම ඵලදායිතා දර්ශකය (අ)**

1995=100

| කාණ්ඩය | 1997 | 1998 | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 108.2 | 113.9 | 5.3 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 104.0 | 107.8 | 3.7 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 101.0 | 101.3 | 0.3 |
| 4. කඩදසි හා කඩදසි නිෂ්පාදිත | 96.0 | 99.0 | 3.1 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 107.1 | 112.5 | 5.0 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 97.7 | 100.3 | 2.7 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 100.4 | 101.6 | 1.2 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 105.7 | 107.5 | 1.7 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 106.4 | 104.4 | -1.9 |
| එකතුව | 101.8 | 106.0 | 4.1 |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන ආයතන 475 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**4.9 සංඛ්‍යා සටහන**

**පෞද්ගලික අංශයේ කර්මාන්තවල සේවා නියුක්තිය**

| කාණ්ඩය | 1997 | 1998 | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| (i)ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්ත (අ) | | | |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 25,282 | 26,132 | 3.4 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 34,599 | 35,865 | 3.7 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 2,166 | 2,334 | 7.8 |
| 4. කඩදසි හා කඩදසි නිෂ්පාදිත | 6,135 | 6,261 | 2.1 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 20,815 | 21,215 | 1.9 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 13,293 | 12,991 | -2.3 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 783 | 818 | 4.5 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 5,968 | 6,538 | 9.6 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 5,624 | 5,590 | -0.6 |
| අනු එකතුව | 114,665 | 117,744 | 2.7 |
| (ii)ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් | 258,185 | 294,381 | 14.0 |
| මුළු එකතුව | 372,850 | 412,125 | 10.5 |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන ආයතන 475 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

පහත හෙළීමට උපකාරී විය. දව සහ දව නිෂ්පාදන සහ සකස් කළ ලෝහ යන කාර්මික කාණ්ඩයන්හි සේවා නියුක්තිය සියයට 7 කට වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන (සියයට 3.4); රෙදිපිළි, ඇඟළුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදන (සියයට 3.7) සහ මූලික ලෝහ නිෂ්පාදන (සියයට 4.5) යන කාණ්ඩයන්හි සේවා නියුක්ති වර්ධනයක් දක්නට ලැබුණි. 1998 වසර තුල ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත අංශයෙහි සේවා නියුක්තිය සියයට 2.3 කින් පහත වැටී ඇත.

## 4.5 ආයෝජන

ආසියානු කලාපයෙහි විදේශ පෞද්ගලික ආයෝජන සඳහා වූ ජාත්‍යන්තර ක්‍රියාකාරිත්වය උදාසීන තත්ත්වයක පැවතින. කෙසේ වුවද, 1998 වසර තුල ශ්‍රී ලංකාව සාමාන්‍ය

පසුගිය වර්ෂයේ අනුමත කළ ව්‍යාපෘතීන් 328 ට සාපේක්ෂව 1998 දී ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ නව ආයෝජන ව්‍යාපෘතීන් 400 ක් අනුමත කර ඇත. අනුමත කරනු ලැබූ ආයෝජන ව්‍යාපෘතීන්හි මුළු ආයෝජන ප්‍රමාණය 1997 වර්ෂයේදී වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 73,607 ට සාපෙක්ෂව 1998 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 158,107 දක්වා ඉහළ ගියේය. 1998 වර්ෂයේදී අනුමත කරනු ලැබූ මුළු ව්‍යාපෘති සංඛ්‍යාවෙන් ව්‍යාපෘති 82 ක් මුළුමනින්ම විදේශීය ආයෝජකයන් සතු වූ අතර, ව්‍යාපෘතීන් 108 ක් දේශීය හා විදේශීය හවුල් ව්‍යාපෘති විය. ව්‍යාපෘතීන් 210 ක් මුළුමනින්ම දේශීය ආයෝජකයන් සතු විය. මෙම ව්‍යාපෘතීන් මගින් පුද්ගලයන් 92,012 දෙනෙකුට රැකියා අවස්ථා සැපයීමට හැකි බව ඇස්තමේන්තු කර ඇත. 1998 වර්ෂයේදී අනුමත කරන ලද ව්‍යාපෘතීන්හි විදේශීය ආයෝජන සහභාගිත්වය සියයට 72 ක් වේ. මෙම ආයෝජන ප්‍රධාන

**4.10 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් දැනට කර ඇති ආයෝජන (අ)**

| කාණ්ඩය | ව්‍යාපෘති සංඛ්‍යාව | | විදේශ ආයෝජන (රු.ද.ල.) | | මුළු ආයෝජන (ආ) (රු.ද.ල.) | |
|---|---|---|---|---|---|---|
| | 1997(ඇ) | 1998(ඈ) | 1997(ඇ) | 1998(ඈ) | 1997(ඇ) | 1998(ඈ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 92 | 149 | 4,253 | 5,200 | 7,923 | 11,392 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 287 | 386 | 15,456 | 16,819 | 21,843 | 25,021 |
| 3. දව හා දව නිෂ්පාදිත | 21 | 26 | 514 | 671 | 689 | 935 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 14 | 22 | 438 | 461 | 688 | 649 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 76 | 101 | 5,920 | 7,121 | 7,173 | 9,370 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 48 | 66 | 1,035 | 3,044 | 1,985 | 4,841 |
| 7. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 25 | 35 | 1,185 | 2,832 | 1,817 | 3,616 |
| 8. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 122 | 171 | 4,207 | 5,646 | 6,179 | 8,853 |
| 9. සේවා | 300 | 402 | 45,679 | 58,438 | 70,700 | 86,529 |
| එකතුව | 985 | 1,358 | 78,687 | 100,232 | 118,997 | 151,206 |


(අ) වර්ෂය අවසානයේ එකතු වූ අගය
(ආ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති
(ඇ) සංශෝධිත
(ඈ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

වශයෙන් ඉහළ පෞද්ගලික විදේශ ආයෝජන ප්‍රමාණයක් ලබා ගැනීමට සමත් විය. විදේශ ආයෝජන දිරි ගැන්වීමේ රජයේ ප්‍රධානතම ආයතනය වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, 1998 වසර තුල දී ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, සිංගප්පූරුව, ජර්මනිය, ඉතාලිය, තායිලන්තය සහ බෙල්ජියම යන රටවලට ආයෝජන ප්‍රවර්ධන කණ්ඩායම් කිහිපයක් යැවීය. වාණිජ්‍ය සහ කර්මාන්ත සඳහා වන ඉන්දියානු වෙළෙඳ මණ්ඩලයෙහි සහ ආසියා ශාන්තිකර වෙළෙඳ මණ්ඩල සන්ධානයෙහි නියෝජිතයින් නව ආයෝජන අවස්ථා ගැන සොයා බැලීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණි අතර, ඕස්ට්‍රේලියාව, ජර්මනිය සහ චීනය යන රට වලින්ද ආයෝජන අවස්ථා ගැන සොයා බැලීම සඳහා විශේෂ නියෝජිත කණ්ඩායම් ලංකාවට පැමිණ ඇත. ආයෝජන මණ්ඩලය යටතේ පවතින ව්‍යවසායයන්හි දැනට ආයෝජනය කර ඇති මුදල් ප්‍රමාණය 1997 දී රුපියල් දශ ලක්ෂ 27,375 ක් වූ අතර, 1998 දී එය රුපියල් දශ ලක්ෂ 32,209 දක්වා සියයට 17.6 කින් වැඩි වී ඇත.

**4.7 රූප සටහන**

**ආයෝජන මණ්ඩලය මගින් දැනට කර ඇති ආයෝජන**



### 4.11 සංඛ්‍යා සටහන
### ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්හි සේවා නියුක්තිය සහ අපනයන ඉපැයුම්

| කාණ්ඩය | සේවා නියුක්තිය දෙසැම්බර් අවසානයට | | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස.) රු.දශ ලක්ෂ | |
|---|---|---|---|---|
| | 1997 | 1998 (අ) | 1997 | 1998 (අ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 8,625 | 11,699 | 5,653 | 9,333 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 161,321 | 189,395 | 98,203 | 114,721 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 3,147 | 2,723 | 396 | 380 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 1,011 | 871 | 1,144 | 1,133 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 22,319 | 25,699 | 17,260 | 20,300 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 9,709 | 10,920 | 6,496 | 5,657 |
| 7. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 1,681 | 2,503 | 1,685 | 3,424 |
| 8. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 31,563 | 31,538 | 15,143 | 16,649 |
| 9. සේවා (ආ) | 18,809 | 19,033 | 8,908 | 9,884 |
| එකතුව | 258,185 | 294,381 | 154,888 | 181,481 |

(අ) තාවකාලික

(ආ) එයාර් ලංකා සමාගම හැර


මූලය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

වශයෙන් ඕස්ට්‍රේලියාව, චීනය, ප්‍රංශය, හොංකොං, ජපානය, කොරියාව, නෙදර්ලන්තය සහ ඇමරිකා එක්සත් ජනපදය යන රට වලින් ලැබී ඇත. 1998 දී අනුමත කල ව්‍යාපෘතීන් අතුරින් ව්‍යාපෘතීන් 131 ක් රෙදිපිළි, ඇඟළුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදන කාණ්ඩයටද, 34 ක් ආහාර, පාන වර්ග සහ දුම්කොළ කාණ්ඩයටද, 25 ක් රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල් නිෂ්පාදන, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයට අයත් වූ අතර, ඉතිරි ව්‍යාපෘතීන් සේවා අංශයද ඇතුළුව අනෙකුත් අංශවලට අයත් වේ.


පසුගිය වර්ෂයේදී මෙන්ම ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘතීන් සංඛ්‍යාව මෙම වර්ෂයේදීද සැළකිය යුතු ලෙස ඉහළ ගියේය. ආයෝජන මණ්ඩලය විසින් 1998 වර්ෂය තුලදී රුපියල් දශ ලක්ෂ 48,635 ක් ආයෝජනය කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතීන් 229 ක් සඳහා ගිවිසුම් අත්සන් තබන ලදී. 1997 වර්ෂයේදී ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘතීන් සංඛ්‍යාව 185 ක් වූ අතර ඒවායේ ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 39,820 ක් විය. ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘතීන්හි ආයෝජනය කරන ලද මුළු මුදලින් රුපියල් දශ ලක්ෂ 25,847 ක් හෙවත් සියයට 53 ක් විදේශීය ආයෝජනයන් වේ. 1998 වර්ෂය වනවිට ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘතීන් 1,693 න් රුපියල් දශ ලක්ෂ 118,207 ක ආයෝජන ප්‍රමාණයක් සහිත ව්‍යාපෘතීන් 927 ක් වාණිජමය නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබුණි. එම ආයෝජන ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 73,836 ක් හෙවත් සියයට 62 ක් විදේශීය ආයෝජනයන් විය. මෙම ව්‍යාපාතීන් මගින් 254,505 දෙනෙකුට රැකියා අවස්ථා සැපයිය හැකි බවට ඇස්තමේන්තුකර ඇත. 1998 වර්ෂය අවසාන වනවිට කටුනායක අපනයන සැකසුම් කලාපයෙහි ව්‍යාපෘතීන් 96 ක්ද, බියගම අපනයන සැකසුම් කලාපයේ ව්‍යාපෘතීන් 58 ක්ද, කොග්ගල අපනයන සැකසුම් කලාපයේ ව්‍යාපෘතීන් 11 ක්ද, මීරිගම අපනයන සැකසුම් කලාපයෙහි ව්‍යාපෘතීන් 2 ක්ද, මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානයෙහි ව්‍යාපෘති

### 4.8 රූප සටහන
### අනුමත කළ සහ ගිවිසගත් ආයෝජන මණ්ඩල ව්‍යාපෘති

4.8.1 රූප සටහන
අනුමත කළ හා ගිවිසගත් ව්‍යාපෘතීන්




4.8.2 රූප සටහන
අනුමත කළ හා ගිවිසගත් ආයෝජන



4 ක්ද, මහනුවර කාර්මික උද්‍යානයෙහි ව්‍යාපෘති 4 ක් සහ අපනයන සැකසුම් කලාපයන්ගෙන් පිටත ව්‍යාපෘති 752 ක්ද පිහිටා තිබුණි. මෙයින් විශාල ප්‍රමාණයක් ඇඟලුම් කර්මාන්තශාලා විය.

1998 වර්ෂය තුළදී ආයෝජන මණ්ඩල පනතෙහි 16 වන වගන්තිය (සාමාන්‍ය නීතිය) යටතේ ව්‍යාපෘතීන් 90 ක් ආයෝජන මණ්ඩලය විසින් අනුමත කර ඇත. මෙම ව්‍යාපෘතීන්හි අපේක්ෂිත මුළු ආයෝජනය රුපියල් දශ ලක්ෂ 5,205 ක් වන අතර විදේශීය ආයෝජනය රුපියල් දශ ලක්ෂ 2,645 ක් හෙවත් සියයට 50 ක් වේ. මෙම ආයෝජනයන්හි අපේක්ෂිත රැකියා අවස්ථා සංඛ්‍යාව 3,164 ක් වේ. පසුගිය වර්ෂයේදී එම සංඛ්‍යාව 4,046 ක් විය. අනුමත කරනු ලැබූ ව්‍යාපෘතීන් සංඛ්‍යාවෙන් 42 ක් සම්පූර්ණයෙන් විදේශීය ආයෝජකයින් සතු වූ අතර, 47 ක් දේශීය හා විදේශීය හවුල් ව්‍යාපාර විය. ආයෝජන මණඩල පනතේ 16 වගන්තිය යටතේ 1998 වර්ෂය අවසන් වනවිට ව්‍යාපෘතීන් 397 ක් සිය කටයුතු ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතීන්හි ආයෝජනය කරනු ලැබූ මුළු මුදල රුපියල් දශ ලක්ෂ 18,416 ක් වන අතර මෙයින් රුපියල් දශ ලක්ෂ 9,689 ක් හෙවත් සියයට 52 ක් විදේශීය මාර්ග වලින් සැපයුනු ආයෝජනයන් විය.

## දේශීය ආයෝජන

1998 වර්ෂය තුළදී ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති 400 හි මුළු දේශීය ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 44,122 ක් හෙවත් මුළු ආයෝජන ප්‍රමාණයෙන් සියයට 28 ක් විය. 1998 දී ගිවිස ගත් ව්‍යාපෘතීන්හි ඇස්තමේන්තුගත දේශීය ආයෝජනය රුපියල් දශ ලක්ෂ 19,787 ක් හෙවත් මුළු ආයෝජනයන්ගෙන් සියයට 40 ක් විය. 1998 අවසානය වනවිට ආයෝජන මණ්ඩලය යටතේ වාණිජමය වශයෙන් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 927 හි දේශීය ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 44,370 ක් හෙවත් සමස්ත ආයෝජනයෙන් සියයට 38 ක් විය. මෙම ආයෝජනයන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අපනයන සැකසුම් කලාපයන්ගෙන් පිටත ස්ථානගත වී තිබුණි.

1998 අවසානය වනවිට කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කළ ව්‍යවසායයන් 1,731 ක මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 89,728 ක් විය. මෙම කර්මාන්තයන්හි අපේක්ෂිත රැකියා ප්‍රමාණය පුද්ගලයින් 2,92,841 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙම ආයෝජනයන් ප්‍රධාන වශයෙන් යොමු වූයේ රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත, රසායන, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන යන කාණ්ඩවලටය.

## 4.6 කර්මාන්ත අංශයට ලබා දී ඇති ණය

වර්ෂය තුළදී දිගුකාලීන ණය දෙන ආයතන සහ වාණිජ බැංකු මගින් කර්මාන්ත අංශයට සපයන ලද ණය පහසුකම් ඉහළ ගියේය. වාණිජ බැංකු මගින් ප්‍රධාන වශයෙන් කෙටිකාලීන ණය පහසුකම් සලසන ලද අතර, ජාතික සංවර්ධන බැංකුව සහ ලංකා සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව මගින් සෘජු ණය සහ හිමිකම් සහභාගිත්වය මගින් දිගුකාලීන ණය සැපයීම තවදුරටත් කරගෙන යන ලදී. මෙයට අමතරව ජාතික සංවර්ධන බැංකුව විසින් 1997 දී දියත් කරන ලද කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහයෝගිතා ව්‍යාපෘතිය යටතේ ප්‍රතිමූල්‍ය සපයා ඇත. ඒ

**4.12 සංඛ්‍යා සටහන**

**ලංකා සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව සහ ජාතික සංවර්ධන බැංකුව විසින් කර්මාන්ත අංශයට සපයා ඇති මූල්‍ය පහසුකම් - 1998 (අ)**

| කාණ්ඩය | සුළු හා මධ්‍ය පරිමාණ සහයෝගිතා ව්‍යවසායන යටතේ අනුමත ප්‍රතිමූල්‍ය පහසුකම් | | ජාතික සංවර්ධන බැංකුව: සෘජු මූල්‍ය පහසුකම්(ආ) | | ජාතික සංවර්ධන බැංකුව: ප්‍රාග්ධන සහභාගිත්වය | | ජාතික සංවර්ධන බැංකුව: එකතුව | | ලංකා සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව: අනුමත කළ ණය | | ලංකා සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව: ප්‍රාග්ධන සහභාගිත්වය | | ලංකා සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව: එකතුව | | මුළු එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. | සංඛ්‍යාව | ප්‍රමාණය රු.ද.ල. |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 225 | 263 | 65 | 1,982 | 1 | 60 | 291 | 2,305 | 148 | 1,559 | - | - | 148 | 1,559 | 439 | 3,864 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 70 | 70 | 52 | 663 | 1 | 75 | 123 | 808 | 66 | 1,039 | - | - | 66 | 1,039 | 189 | 1,847 |
| 3. දව හා දව නිෂ්පාදිත | 97 | 107 | 41 | 102 | - | - | 138 | 209 | 42 | 50 | - | - | 42 | 50 | 180 | 259 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | - | - | 27 | 499 | - | - | 27 | 499 | 25 | 100 | - | - | 25 | 100 | 52 | 599 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 127 | 170 | 94 | 1,219 | 3 | 530 | 224 | 1,919 | 53 | 824 | - | - | 53 | 824 | 277 | 2,743 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | - | - | 2 | 17 | - | - | 2 | 17 | 13 | 429 | - | - | 13 | 429 | 15 | 446 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | - | - | - | - | - | - | - | - | 9 | 51 | - | - | 9 | 51 | 9 | 51 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | - | - | - | - | - | - | - | - | 74 | 436 | - | - | 74 | 436 | 74 | 436 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 794 | 726 | 528 | 10,481 | 7 | 564 | 1,329 | 11,771 | - | - | - | - | - | - | 1,329 | 11,771 |
| එකතුව | 1,313 | 1,336 | 809 | 14,963 | 12 | 1,229 | 2,134 | 17,528 | 430 | 4,488 | - | - | 430 | 4,488 | 2,564 | 22,016 |

(අ) තාවකාලික

(ආ) ව්‍යාපෘති සහ උපකරණ මූල්‍ය ණය පමණි.

මූලය : ලංකා සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව, ජාතික සංවර්ධන බැංකුව

සඳහා ආසියානු සංවර්ධන බැංකුව හා විදේශීය වාණිජ මූලයන්ගෙන් රැස්කරන ලද අරමුදල් යොදවා ඇත.

කර්මාන්ත අංශයට ජාතික සංවර්ධන බැංකුව සහ ලංකා මූල්‍ය සංවර්ධන සමායතන බැංකුව ඒකාබද්ධව රුපියල් දශලක්ෂ 22,016 ක මූල්‍ය පහසුකම් අනුමත කර ඇත. එය 1997 දී අනුමත කළ මූල්‍ය පහසුකම් ප්‍රමාණය වූ රුපියල් දශලක්ෂ 15,575 ට සාපේක්ෂව සියයට 41 ක ඉහළ යාමකි. මෙම මූල්‍ය පහසුකම් වලින් විශාල කොටසක් ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන කාණ්ඩය සහ රසායනික, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩ සඳහා ලබාදී ඇත. ආහාර, පාන වර්ග සහ දුම්කොළ කාණ්ඩයෙහි ව්‍යාපෘති 439 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 3,864 ක මුදලක්ද, .රසායනික, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයෙහි ව්‍යාපෘති 277 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 2,743 ක්ද අනුමත කර ඇත. 1997 වර්ෂයේදී වාණිජ බැංකු මඟින් කර්මාන්ත අංශය සඳහා සපයනු ලැබූ රුපියල් දශ ලක්ෂ 25,000 ක ණයට සාපේක්ෂව 1998 පළමු මාස 9 තුළදී රුපියල් දශ ලක්ෂ 27,000 ක මුදලක් වාණිජ බැංකු මඟින් සපයා ඇත. කර්මාන්ත අංශයට ප්‍රදානය කරන ලද ණය ප්‍රමාණය ආසන්න වශයෙන් සියයට 12 කින් වර්ධනය වී ඇත.

වර්ෂය තුළදී ජාතික සංවර්ධන බැංකුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහයෝගිතා ව්‍යාපෘතිය මඟින් සැපයෙන ප්‍රතිමූල්‍ය ණය පහසුකම් යටතේ ව්‍යාපෘති 1,313 ක් සඳහා රුපියල් මිලියන 1,336 ක් අනුමත කර ඇත. මෙයින් ආහාර, පාන වර්ග සහ දුම්කොළ කාණ්ඩයෙහි ව්‍යාපෘති 225 ක් සඳහා රුපියල් මිලියන 263 ක ණය ප්‍රමාණයක්ද, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයෙහි ව්‍යාපෘති 127 ක් සඳහා රුපියල් මිලියන 170 ක්ද, දැව හා දැව නිෂ්පාදන කාණ්ඩයෙහි ව්‍යාපෘති 97 ක් සඳහා රුපියල් මිලියන 107 ක ණය ප්‍රමාණයක්ද අනුමත කර ඇත. පසුගිය වසරේදී ව්‍යාපෘති අටක් සඳහා ලබා දුන් රුපියල් දශ ලක්ෂ 418 ක මූල්‍ය දායකත්වය හා සැසඳීමේදී 1998 දී ව්‍යාපෘති 12 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 1,229 ක මූල්‍ය දායකත්වයක් ජාතික සංවර්ධන බැංකුව මඟින් සපයනු ලැබූණි. මෙම රුපියල් දශ ලක්ෂ 1,229 න් රුපියල් දශ ලක්ෂ 530 ක් පමණ රසායනික, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත කාණ්ඩයෙහි ව්‍යාපෘති 3 ක් සඳහා සපයා ඇත. සෘජු මූල්‍ය ආධාරයන් වශයෙන් ජාතික සංවර්ධන බැංකුව කර්මාන්ත අංශයට දෙන ලද ණය, ප්‍රධාන ණය සැපයුම් මාර්ගය විය. ජාතික සංවර්ධන බැංකුව පසුගිය වර්ෂයේදී ව්‍යාපෘති 733 ක් සඳහා අනුමත කළ රුපියල් දශ ලක්ෂ 11,647 ට සාපේක්ෂව 1998 දී ව්‍යාපෘති 809 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 14,963 ක සෘජු මූල්‍ය පහසුකම් අනුමත කරන ලදී. මෙය පෙර වර්ෂයේ අනුමත කළ ණය ප්‍රමාණයට වඩා සියයට 29 ක වැඩි වීමකි. ණය අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාවෙහිද සියයට 10 ක වැඩි වීමක් විය. මෙම මූල්‍ය පහසුකම් වලින් වැඩි ප්‍රමාණයක් ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත කාණ්ඩයෙහි සහ රසායනික, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයන්හි ව්‍යාපෘති සඳහා විය.

ලංකා සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව මඟින් මූල්‍යකරණය කරන ලද ව්‍යාපෘති සහ අනුමත කරන ලද ණය ප්‍රමාණය 1998 වර්ෂය තුළදී සැළකිය යුතු ලෙස ඉහළ ගියේය. ලංකා සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව 1997 දී ව්‍යාපෘති 337 ක් සඳහා අනුමත කළ රුපියල් දශ ලක්ෂ 3,380 හා සැසඳීමේදී මෙම වර්ෂය තුළදී කාර්මික ව්‍යාපෘති 430 ක් සඳහා රුපියල් දශ ලක්ෂ 4,488 ක ණය ප්‍රමාණයක් අනුමත කර ඇත. මෙම රුපියල් දශ ලක්ෂ 4,488 න් රුපියල් දශ ලක්ෂ 1,559 ක් ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන කාණ්ඩයෙහි ව්‍යාපෘති 148 ක් සඳහාද, රුපියල් දශ ලක්ෂ 1,039 ක් රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදන කාණ්ඩයෙහි ව්‍යාපෘති 66 ක් සඳහාද, රුපියල් දශ ලක්ෂ 824 ක් රසායනික, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන කාණ්ඩයෙහි ව්‍යාපෘති 53 ක් සඳහාද විය.

## 4.7 කාර්මික ප්‍රතිපත්තිය

දේශීය කර්මාන්ත පදනම පුළුල් කිරීම, විවිධාංගීකරණය සහ ව්‍යාප්ත කිරීම හා භෞතික හා මිනිස්බල සම්පත්වල කාර්යක්ෂම කළමනාකරණය, ග්‍රාමීය හා නාගරික අංශවල නව රැකියා අවස්ථා උත්පාදනය, අපනයන ප්‍රවර්ධනය සහ කර්මාන්ත ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත කිරීම රජයේ කාර්මික ප්‍රතිපත්තියෙහි ප්‍රධාන අරමුණු විය. වේගවත් කාර්මික වර්ධනයක් සඳහා අවශ්‍ය සාර්ව ආර්ථික පරිසරයක් ඇති කිරීම, පෞද්ගලික අංශයේ සහභාගිත්වය දිරි ගැන්වීම, සෘජු විදේශීය ආයෝජන ප්‍රවර්ධනය කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශය පුළුල් කිරීමට පහසුකම් සැලසීම, කර්මාන්ත ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත කිරීම, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වාණිජකරණය දිරි ගැන්වීම, කුඩා සහ විශාල ආයතන අතර සම්බන්ධතා වර්ධනය තුළින් මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිතය.

පවත්නා තීරු බදු ව්‍යුහය වඩාත් විධිමත් කිරීම සඳහා වෙළෙඳ හා තීරු බදු පිළිබඳ ජනාධිපති කොමිසමක් පත් කරනු ලැබිණ. පවත්නා තීරු බදු අනුපාත අඩු කිරීම සහ පියවර දෙකකදී අනු කාණ්ඩ දෙකින් යුත් තීරු බදු ක්‍රමයක් සඳහා යොමු වීම මෙම කොමිසම විසින් නිර්දේශ කරන ලදී. වසර 2000 දී අනු කාණ්ඩ දෙකකින් යුත් තීරු බදු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව 1999 රජයේ අයවැය ලේඛණයෙහිද දක්වා ඇත. දනට පවත්නා සම්මත තීරු බදු අනුපාත වූ සියයට 10, 20 සහ සියයට 35 ක් වූ තීරු බදු අනුපාත පිළිවෙලින් 5, 10 සහ සියයට 30 ක් ලෙස වෙනස් කෙරෙනු ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය නොකරන ලද සියළු ආනයනික කාර්මික අමු ද්‍රව්‍ය හා යන්ත්‍රසූත්‍ර සඳහා සියයට 5 ක බදු අනුපාතයක් අය කරනු ඇත. මේ පියවර මඟින් නිෂ්පාදන පිරිවැය අඩු වීමත්, එමඟින් ශ්‍රී ලාංකික නිෂ්පාදනයන් සඳහා වූ තරගකාරිත්වය ඉහළ නැංවීමත් අපේක්ෂා කෙරේ.

රේගු පරිපාලනය දියුණු කිරීම සඳහා රේගු ආඥා පනතේ විධිවිධාන මුළුමණින්ම විමර්ශනයට ලක් කරන ලෙස වෙළෙඳම හා තීරු බදු සඳහා වූ ජනාධිපති කොමිසම

විසින් නිර්දේශ කර ඇත. රේගු කටයුතුවල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම මගින් අමු ද්‍රව්‍ය ඉක්මණින් ලබා ගැනීමට හැකි වීමත්, නිෂ්පාදන කලට වේලාවට බෙද හැරීමට හැකි වීමත් මගින් අපනයනාභිමුඛ කර්මාන්තවලට ලෝක වෙළෙඳපොළෙහි සිය තරගකාරිත්වය පවත්වාගෙන යාමට උපකාරී වනු ඇත. මේ සඳහා රේගු ආඥා පනතේ විධිවිධාන මුළුමනින්ම විමර්ශනයට ලක් කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයෙන්ම සමන්විත විශේෂඥ කමිටුවක් පත් කිරීමට 1999 අයවැය මගින් යෝජනා කර ඇත. අපනයනකරුවන් අමතර වියදමක් නොවන ලෙස ශ්‍රී ලංකා රේගුවේ සහ වරාය අධිකාරියේ සේවා පැය ගණන වැඩි කිරීමටද 1999 අයවැය මගින් යෝජනා කර ඇත.

කර්මාන්ත සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම පිණිස රජය පියවර රැසක් ගෙන ඇත. විදුලි සංදේශ සේවා සහ බලශක්ති උත්පාදනය පුළුල් කිරීම, වරාය සංවර්ධනය, කාර්මික උද්‍යාන සහ කර්මාන්තපුර දියුණු කිරීම වැනි පියවර මගින් කාර්මික ආයෝජන දිරිමත් කිරීමට අපේක්ෂා කෙරේ. 1999 අයවැය මගින් පුහුණු ශ්‍රම හිඟය පිළිබඳ ප්‍රශ්නය විසඳීම සඳහා පුහුණු ශ්‍රමිකයන් බඳවා ගැනීමට, උසස් කිරීමට සහ සේවා නියුක්තයින් නැවත පුහුණු කරවීමට මෙන්ම ආයතන පදනම් කර ගත් පුහුණුවක් ලබා දීම සඳහා නිපුණතා සංවර්ධන අරමුදලක් පිහිටුවීමට යෝජනා කර ඇත. මෙයට අමතරව පෞද්ගලික ආයෝජන අධෛර්යමත් කරවන සුළු කම්කරු නීති සංශෝධනයන් කිරීමද ඇතුළත්ව ශ්‍රම වෙළෙඳපොළ වඩාත් නම්‍යශීලී කරලීමේ පියවර ගැනීමද අවශ්‍යයය.

ආනයනික අමු ද්‍රව්‍ය මත රඳා පවත්නා අපනයනය වලට යොමුවූ ඇඟළුම් නිෂ්පාදකයින් මුහුණපාන රේගු කටයුතු හා සම්බන්ධ ගැටළු මඟ හැරවීමට, රෙදිපිළි හා ඒ හා සම්බන්ධ අනෙකුත් අමු ද්‍රව්‍ය වෙනුවෙන් පනවා තිබූ බදු 1998 අයවැය මගින් අහෝසි කර ඇත. මේ අනුව ආනයනික නූල්, රෙදිපිළි, ප්‍රාග්ධන හා ඒ ආශ්‍රිත සියළුම අන්තර් භාණ්ඩ 1997 නොවැම්බර් මස සිට බද්දෙන් නිදහස් කෙරිණ. මෙම ප්‍රතිශෝධනයන්ගෙන් රජය බලාපොරොත්තු වූයේ රේගු ප්‍රමාද වීම් අවම කිරීම, නීති නොවන මාර්ග වලින් බඩු ගෙන්වීම අධෛර්මත් කිරීම, වංචා සහගත ලෙස ඉන්වොයිසි ඉදිරිපත් කිරීම අධෛර්මත් කිරීම හා අපනයන සඳහා ගත වන කාලය අඩු කිරීමත්ය. දේශීය ඇඟළුම් නිෂ්පාදකයින් දිරි ගැන්වීමට නිමි ඇඳුම් ආනයනය සඳහා සියයට 10 ක රේගු බද්දක් පනවනු ලැබූ අතර කර්මාන්ත සහ කම්හල් නවීකරණය කිරීමට සහ නවීන තාක්ෂණය හඳුන්වා දීම සඳහා රෙදිපිළි කර්මාන්තය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනක් දියත් කරනු ලැබුණි.

## කර්මාන්ත අංශයට සපයා ඇති දිරි දීම්

උසස් තාක්ෂණය භාවිතය දිරි ගැන්වීම සඳහා 1996 වර්ෂයේ අයවැය මගින් ලබා දී තිබුණු මූල්‍යමය දිරි ගැන්වීම්, 1998 වර්ෂයේ අයවැය මගින් තවත් අවුරුදු දෙකක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. මෙම යෝජනා ක්‍රමය මගින් රුපියල් දශ ලක්ෂ 4 ඉක්මවා ආයෝජනය කරන නව ව්‍යවසායයන්ට සහ දැනට පවත්නා රුපියල් දශ ලක්ෂය ඉක්මවා ආයෝජනය කරන ව්‍යවසායයන්ට අනුමත යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, බදු රහිතව ආනයනය කිරීමට හැකිවන අතර ලාභාංශ වර්ධනය මත පස් අවුරුදු බදු විරාමයක් පිරිනැමේ. නව තාක්ෂණය අත් කර ගැනීම සඳහා සුළු පරිමාණ ව්‍යවසායකයින් දිරි ගැන්වීමේ අදහසින් අනුමත යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, ආනයනය හා සම්බන්ධ අවම ආයෝජන අවශ්‍යතා 1999 අයවැය මගින් ඉවත් කරනු ලැබිණ. කෙසේ වුවද, ආයෝජන යෙදවුම් දැනට පවත්නා අවම ආයෝජන මට්ටම්වලට වඩා වැඩි නම් පමණක් ආදයම් බදු සහන දීර්ඝ කරනු ලැබේ. 1998 වර්ෂය අවසානය වනවිට මුළු ආයෝජන යෙදවුම් රුපියල් දශ ලක්ෂ 10,883 ක් සහිත නව ව්‍යවසායයන් 142 ක් සහ රුපියල් දශ ලක්ෂ 23,270 ක මුළු ආයෝජන සහිතව දැනට පවත්නා ව්‍යවසායයන් 378 ක් සඳහා මෙම යෝජනා ක්‍රමය යටතේ අනුමැතිය දී ඇත. මේ කාලය තුලදී මෙම යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශ ලක්ෂ 22,465 ක් වටිනා යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයනය කර ඇත. මෙමගින් පුද්ගලයින් 31,771 කට රැකියා අවස්ථා සැපයිය හැකි බවට ඇස්තමේන්තු කර ඇත.

මැණික් සහ ස්වර්ණාභරණ, විද්‍යුත් උපකරණ, පරිගණක මෘදුකාංග සහ ඇඟළුම් වැනි ප්‍රමුඛ අංශවල පුහුණු පහසුකම් සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය දිරි ගැන්වීමේ අදහසින් අවම වශයෙන් පුද්ගලයින් 300 කට පුහුණුව සපයන ආයතනවලට පස් අවුරුදු බදු විරාමයක් ලබා දීම සඳහා ආයෝජන මණ්ඩලය මගින් සැපයෙන දිරි ගැන්වීම් සංශෝධනය කිරීමට 1999 අයවැය මගින් යෝජනා කරන ලදී. මෙම සංශෝධනවලට පෙර ආයෝජන මණ්ඩලය සියයට 15 ක අනුග්‍රහ පූර්වක බදු අනුපාතයන් සහ පුහුණු කිරීමේ ආයතන පිහිටුවීම සඳහා බදු නිදහස් පහසුකම් සලසන ලදී. පවත්නා පුහුණු කිරීමේ ආයතන පුළුල් කිරීමට හා වැඩි දියුණු කිරීමටත්, නව පුහුණු කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීමටත් මූල්‍යමය ආධාර සැපයීමටද යෝජනා කර ඇත. බඳවා ගැනීමේදී ශ්‍රමිකයින් පුහුණු කර බඳවා ගැනීමට, පුහුණු ශ්‍රමිකයින්ගේ හැකියාවන් උසස් කිරීමට, නැවත පුහුණු කරවීමට හා ආයතන පදනම් කර ගත් පුහුණුවක් ලබා දීමට සේවායෝජකයින් දිරි ගැන්වීම යෝජිත නිපුණතා සංවර්ධන අරමුදලේ අරමුණු වේ.

කර්මාන්ත උපදේශක සභාවේ සංවර්ධන විමර්ශන කමිටුවෙහි නිර්දේශ මත විද්‍යුත් උපාංග එකලස් කිරීම, පිඟන් හා වීදුරු භාණ්ඩ, රබර් ආශ්‍රිත කර්මාන්ත, ලුහු හා බැර කර්මාන්ත, මැණික් සහ දියමන්ති කැපීම හා ඔප දැමීම, ස්වර්ණාභරණ නිෂ්පාදනය වැනි කර්මාන්ත කිහිපයක් කඩිනමින් දියුණු කළයුතු කර්මාන්ත ලෙස ප්‍රකාශයට පත් කර ඇත. 1998 දී මෙවැනි කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා විශේෂ දිරි ගැන්වීම් සලසා තිබුණි. නම් කරන ලද කලාප තුල අවම ආයෝජනය රුපියල් දශ ලක්ෂ 50 ක් වන, අවම වශයෙන් රැකියා අවස්ථා 50 ක් උත්පාදනය කරන, නිමැවුමෙන් සියයට 90 ක් අපනයනය කරන කර්මාන්ත පිහිටුවන නව ව්‍යවසායයන් වසර 10 ක බදු විරාමයක් සමඟ අනෙකුත් ආයෝජන මණ්ඩල දිරි ගැන්වීම් හා සහන

**4.13 සංඛ්‍යා සටහන**

**උසස් තාක්ෂණය දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය යටතේ 1998 අවසානය වනවිට අනුමත කළ ව්‍යාපෘති (අ)**

| කාණ්ඩය | නව | | | දැනට පවත්නා | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ආයෝජන රු.ද.ල. | අපේක්ෂිත රැකියා අවස්ථා | සංඛ්‍යාව | ආයෝජන රු.ද.ල. | අපේක්ෂිත රැකියා අවස්ථා | සංඛ්‍යාව | ආයෝජන රු.ද.ල. | අපේක්ෂිත රැකියා අවස්ථා |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 20 | 2,204 | 1,468 | 67 | 6,152 | 3,810 | 87 | 8,356 | 5,278 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 13 | 705 | 1,007 | 40 | 1,832 | 2,640 | 53 | 2,537 | 3,647 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 5 | 220 | 432 | 9 | 203 | 505 | 14 | 423 | 937 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත | 11 | 664 | 838 | 36 | 1,437 | 1,425 | 47 | 2,101 | 2,263 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 38 | 1,642 | 2,241 | 110 | 5,039 | 5,688 | 148 | 6,681 | 7,929 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 7 | 1,408 | 531 | 9 | 428 | 645 | 16 | 1,836 | 1,176 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 5 | 1,004 | 824 | 15 | 1,044 | 840 | 20 | 2,048 | 1,664 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 12 | 665 | 897 | 50 | 2,452 | 2,553 | 62 | 3,117 | 3,450 |
| 9. අනෙකුත් නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 20 | 1,838 | 1,827 | 20 | 689 | 803 | 40 | 2,527 | 2,630 |
| 10. සේවා | 11 | 533 | 609 | 22 | 3,994 | 1,574 | 33 | 4,527 | 2,183 |
| එකතුව | 142 | 10,883 | 10,674 | 378 | 23,270 | 20,483 | 520 | 34,153 | 31,157 |

(අ) තාවකාලික

මූලය : කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

ලැබීම සඳහා පුළුපුකම් ලබනු ඇත. කඩිනමින් දියුණු කළයුතු යයි හඳුනා ගත් කර්මාන්තවල දැනටමත් නිරත ආයෝජන මණ්ඩලයට අයත් නොවන ව්‍යවසායකයින්ට පවත්නා කම්හල් නවීකරණය සඳහා බදු නිදහස් පදනම යටතේ යන්ත්‍රසූත්‍ර ආනයනය කිරීමට අවසර දී ඇත. මෙම නිදහස් බදු සහනවලට අමතරව අවුරුදු 5 ක් තුල සියයට 50 ක අපනයන අවශ්‍යතා සපුරාලන ව්‍යවසායයන්ට අවරුදු 5 ක බදු විරාමයක්, හා සියයට 90 ක අපනයන අවශ්‍යතා සපුරාලන ව්‍යවසායයන් සඳහා අවුරුදු 10 ක බදු විරාමයක් සමඟ පූර්ණ ආයෝජන මණ්ඩල තත්ත්වයන් පිරිනැමේ. තවද, ප්‍රකාශ නොකළ සමුච්චිත ආදයම් කඩිනමින් දියුණු කළයුතු යයි හඳුනා ගත් කර්මාන්තවල ආයෝජනය කරනු ලබන ආයෝජකයන් බදු/විනිමය පාලනය හා සම්බන්ධ ක්ෂමාවන්ට පුළුපුකම් ලබනු ඇත. රත්රන්, මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ නියැලි අයට, ආදායම් බදු නිදහස් කිරීම, ජාතික ආරක්ෂක බද්දෙන් නිදහස් කිරීම, බදු රහිතව මැණික් හා රන් ආනයනය කිරීමට ඉඩ සැලසීම ඇතුළු තවත් දිරි ගැන්වීම් දෙනු ලැබිණ.

නව තාක්ෂණය හඳුන්වා දිමෙන් කාර්යක්ෂම භාවය හා තරගකාරිත්වය වැඩි දියුණු කිරීමට දේශීය රෙදිපිළි නිෂ්පාදකයින් දිරිමත් කිරීම සඳහා රෙදිපිළි ආනයනය ලිහිල් කිරීමෙන් පසු රෙදිපිළි කර්මාන්තය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනක් හඳුන්වා දෙනු ලැබිණ. දැනට ගෙවීමට ඇති ණය, පොලිය සමඟ මුළු ණය ශේෂයන් මාරු කිරීම සඳහා " රෙදිපිළි ණය ආපසු අය කර ගැනීමේ අරමුදල" නමින් විශේෂ අරමුදලක් පිහිටුවන ලදී. එම අරමුදලට ණය පැවරීමෙන් පසු කර්මාන්තය නවීකරණය කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීමට අවශ්‍ය නව මූල්‍ය පහසුකම් කලින් ණය ලබා ගැනීමේදී ඉදිරිපත් කළ ඇපය/උකස මත ලබා ගැනීම සඳහා ව්‍යවසායකයින් පුළුපුකම් ලබනු ඇත. මෙම " ප්‍රතිව්‍යුගත වැඩසටහන" යටතේ සහන ලබා ගැනීම සඳහා 1998 අවසානය වනවිට ව්‍යවසායකයින් 128 දෙනෙකු අයදුම්පත් ඉදිරිපත් කර තිබුණි. මෙයින් අයදුම්පත් 101 ක් වාසිදායක ලෙස සලකා බලන ලද අතර, ඔවුන්ගේ මුළු හිඟ ණය ප්‍රමාණය වූ රුපියල් දශ ලක්ෂ 3,781 ක් " රෙදිපිළි ණය ආපසු අය කර ගැනීමේ අරමුදලට" මාරු කරන ලදී. මෙම ව්‍යවසායකයින් 101 දෙනාගේ ඉල්ලීම් වලින් 5 දෙනෙකුගේ හිමිකම් පෑම් අගැයීම අවසන් කර ඇති අතර, ඉතිරි හිමිකම්පෑම්හි ඇගැයුම් කටයුතු කෙරෙමින් පවතී. රෙදිපිළි ණය ආපසු අය කර ගැනීමේ අරමුදලට ණය මාරු කිරීම සඳහා රජය රුපියල් දශ ලක්ෂ 204.2 ක් (මුල් මුදල රුපියල් දශ ලක්ෂ 97.6 ක් සහ පොලිය රුපියල් දශ ලක්ෂ 106.7) දැනටමත් බැංකුවලට ගෙවා ඇත. 1998 අවසානය වනවිට එක් ව්‍යවසායකයෙකු නවීකරණ ව්‍යාපෘතියක කටයුතුවල නියැලුන අතර අදළ ගිවිසුම් අත්සන් කළ පසු තවත් බොහෝ දෙනෙක් කම්හල් නවීකරණය කිරීම අරඹනු ඇතැයි අපේක්ෂා කෙරේ. බැංකුවල විශ්වාසවත් ගනුදෙනු කරුවන් ලෙස හඳුනා ගත් රෙදිපිළි නිෂ්පාදකයින් සඳහා පූර්ණ පොලී සහනාධාරයක්ද හඳුන්වා දෙනු ලැබිණි. මෙම නිෂ්පාදකයින්ට රෙදිපිළි කර්මාන්තයට අදළ ව්‍යාපෘතිවලට අවශ්‍ය යන්ත්‍රසූත්‍ර අමතර කොටස්, අමු ද්‍රව්‍ය ඇතුළු යෙදවුම් සහ උපාංග බදු රහිතව ආනයනය කිරීමට අවසර දී ඇත. තවද, නිෂ්පාදනවල ගුණාත්මක භාවය ජාත්‍යන්තර වෙළෙඳපළ තතත්වයට උසස් වන තෙක් මෙම වැඩසටහන යටතේ පාසැල් නිල ඇඳුම් සඳහා අවශ්‍ය රෙදිපිළි හා සෞඛ්‍ය අංශය සඳහා අවශ්‍ය අත් වැසුම් හා වෙළුම් පටි වැනි නිෂ්පාදන සහ තැපැල් සහ දුම්රිය දෙපාර්තමේන්තු ආදියෙහි නිල ඇඳුම් සඳහා අවශ්‍ය රෙදිපිළි නිෂ්පාදන 1999 ජනවාරි මාසයේ සිට තෝරා ගත් පේෂකර්මාන්ත නිෂ්පාදකයිනගෙන් ලබා ගැනීමටද රජය තීරණය කර ඇත. මෙම අවශ්‍යතාව සඳහා රාජ්‍ය ආයතනයන්හි රෙදිපිළි අවශ්‍යතාව ඇස්තමේන්තු කිරීමටත්, පංගු පදනමක් මත

වෙන් කිරීම් ලබා දිය යුතු නිෂ්පාදකයින් හඳුනා ගැනීමටත් දේශීය රෙදිපිළි වෙන් කර දීමේ කමිටුවක් කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයෙහි පිහිටුවා ඇත.

ප්‍රාදේශීය වශයෙන් කර්මාන්ත ව්‍යාප්ත කිරීමේ අරමුණින් දිරි ගැන්වීම් යෝජනා ක්‍රමයක් රජය විසින් හඳුන්වා දෙනු ලැබිණි. ඒ අනුව ආයෝජන මණ්ඩලයට අයත් හා ඊට අයත් නොවන වාණිජමය නිශ්පාදනයෙහි නියුතු ව්‍යවසායයන්, 'දුෂ්කර ප්‍රදේශ' හෝ 'වඩාත් දුෂ්කර ප්‍රදේශ' යනුවෙන් හඳුන්වනු ලබන කලාපයක 1998 දෙසැම්බර් 31 දිනට පෙර ව්‍යාප්ති ඒකකයක් පිහිටුවීම හෝ වෙනත් ස්ථානයක ඇති ආයතනයක් දුෂ්කර ප්‍රදේශයක පිහිටුවීම හා අවම වශයෙන් පුද්ගලයින් 150 ක් සඳහා සේවා අවස්ථාවන් සැපයීම සහ අවම වශයෙන් නිෂ්පාදනයෙන් සියයට 50 ක් අපනයනය කරන ව්‍යවසායයන් මෙම දිරි දීමනා ලැබීමට හිමිකම් ලබනු ඇත. ඇඟළුම් කර්මාන්ත සම්බන්ධයෙන් මෙම අවම අපනයන අවශ්‍යතාවය නිෂ්පාදිතයෙන් සියයට 90 ක් වනු ඇත. දැනටමත් පවත්නා ව්‍යවසායයන් 'දුෂ්කර ප්‍රදේශයක' හෝ 'වඩාත් දුෂ්කර ප්‍රදේශයක' ව්‍යාප්ති ඒකකයක් පිහිටුවීම හෝ නැවත පිහිටුවීමක් කරන්නේ නම් අනෙකුත් ආයෝජන මණ්ඩලීය දිරි ගැන්වීම්ද ඇතුළුව පිළිවෙලින් අවරුදු 5 ක හා 8 ක බදු විරාම කාලයකට හිමිකම් ලබනු ඇත. දැනටමත් දුෂ්කර හා වඩාත් දුෂ්කර ප්‍රදේශවල පිහිටුවා ඇති ආයෝජන මණ්ඩලය යටතේ වන ව්‍යවසායයන් ඇඟළුම් හා ඒ හා සම්බන්ධිත භාණ්ඩ නිෂ්පාදනය සඳහා සහ වෙනත් නිෂ්පාදන සඳහා අවශ්‍ය උසස් තාක්ෂණය සම්බන්ධව විශේෂඥ පුහුණුව ලබාදෙන මධ්‍යස්ථාන පිහිටුවන්නේ නම් සහ එම ව්‍යවසායයන්හි අවම වශයෙන් පුදගලයින් 100 කට වැඩි ප්‍රමාණයකට 1998 දෙසැම්බර් මස 31 දිනට පෙර සේවා නියුක්ති අවස්ථා සලසන්නේ නම් එම ව්‍යවසායයන්ට අතිරේක පස් අවුරුදු බදු විරාමයක් සහ අනෙකුත් දිරි ගැන්වීම් ලබා දීමටද යෝජනා කර ඇත. මෙම දිරි ගැන්වීම් යෝජනා ක්‍රමය 1998 දී අවසන් වීමට නියමිතව තිබුණද, එය 1999 දෙසම්බර් 31 දින දක්වා දීර්ඝ කිරීමට 1999 අයවැය මඟින් යෝජනා කරන ලදි.

## ජාතික ඵලදායිතා දස අවුරුදු වැඩසටහන

පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ඵලදායිතා වර්ධනය කිරීමේ අරමුණෙන් 1997 දී දියත් කරන ලද " ජාතික ඵලදායිතා දස අවරුදු වැඩසටහන" 1998 දී ද නොකඩවා ක්‍රියාත්මක විය. රාජ්‍ය අංශයේ ඵලදායිතා වර්ධනය අවධාරණය කිරීමේ අදහසින් දුරස්ථ ප්‍රදේශවලට ඵලදායිතාව වර්ධනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ පණිවිඩය ගෙන යමින්ද, ඵලදායිතා වර්ධනය සඳහා උපාය මාර්ගික පස් අවුරුදු සැලැස්මක් සැකසීම තුලින්ද ඵලදායිතා වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වැදගත් වසරක් ලෙස 1998 වසර සලකනු ලැබුණි. රාජ්‍ය, පෞද්ගලික සහ අවිධිමත් අංශවල නායකත්වය වර්ධනය තුලින් මානව සම්පත් සංවර්ධනය තොරතුරු තාක්ෂණය දියුණු කිරීම, මූල්‍ය උපයෝජනයේ වර්ධනය සහ නීති රෙගුලාසි හා විධිවිධාන ප්‍රතිශෝධන හඳුන්වා දීම ආදිය පස් අවරුදු සැලසුමෙහි ඉලක්ක විය. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයට අනුව 1999 සිට පස් අවුරුදු සැලසුම ක්‍රියාත්මක කරනු ඇත. කම්කරු සහභාගිත්වය ජනප්‍රිය කරවීමේ ක්‍රමෝපායයන්ට හා සේවකයන්, නිෂ්පාදකයින් හා සාමාන්‍ය ජනතාව අතර 'ඵලදායිතාවය' පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීමට කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විශේෂ අවධානයක් යොමු කර ඇත. සෑම අමාත්‍යාංශයකම පාහේ ඵලදායිතා ඒකක පිහිටුවා ඇති අතර අදළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රාජ්‍ය අංශයේ සංවිධානවල ඵලදායිතා වර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සඳහා බලය ලත් නිලධාරීන් පත් කර ඇත. මහජනතාව තුල ඵලදායිතා වර්ධනය පිළිබඳ අවබෝධය ඇති කිරීමේ අවශ්‍යතාව අවධාරණය කිරීම පිණිස ගුවන්විදුලි සාකච්ඡා වැඩසටහන්වලට ප්‍රමුඛත්වය දෙන ලදී. මේ සඳහා 1998 වර්ෂය තුලදී ඉංග්‍රීසි වැඩසටහන් 50 ක්ද, සිංහල වැඩසටහන් 50 ක්ද, ළමා වැඩසටහන් 52 ක්ද ප්‍රචාරය කරන ලදී.

## 4.8 කර්මාන්ත ස්ථානගත වීම

වරායට සහ ගුවන්තොටුපලට සමීප වීමත්, වඩා හොඳ යටිතල පහසුකම් තිබීමත් හේතුවෙන් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන්හි සිය කර්මාන්ත ස්ථානගත කිරීමට බොහෝ කර්මාන්තකරුවෝ වැඩි කැමැත්තක් දක්වති. මෙම දිස්ත්‍රික්කයන්හි කර්මාන්ත ඒකරාශී වීම නිසා අඟනුවර ජනගහණ තදබදය, කර්මාන්ත සඳහා ශ්‍රම හිඟය, පරිසර දූෂණය හා ඉඩම්වල පවත්නා මිල ගණන් ඉහළ යාම ඇතුළුව සමාජ හා ආර්ථික ප්‍රශ්න රාශියක් පැන නැගී ඇත. රැකියා හා ආයෝජන සඳහා මෙම ප්‍රදේශවලට ජනතාව සංක්‍රමණය වීම අධෛර්යමත් කිරීමට හා අධික ලෙස මෙම ප්‍රදේශයන්හි කර්මාන්ත ඒකරාශී වීම අඩු කිරීමට මෑතකදී රජය ප්‍රතිපත්තිමය තීරණ කිහිපයක් ගෙන ඇත. මේ සම්බන්ධයෙන් රජය ගත් වඩාත් වැදගත් පියවර අතර ඇඟළුම් කම්හල් 200 වැඩසටහන සහ ඇඟළුම් කම්හල් 50 වැඩසටහන, කොග්ගල, මහනුවර, මල්වත්ත, වතුපිටිවල හා මීරිගම වැනි ප්‍රදේශවල කුඩා ආපනයන සැකසුම් කලාප හෝ උද්‍යාන පිහිටුවීම, ප්‍රාදේශීය කර්මාන්ත උද්‍යාන හඳුන්වා දීම, කාර්මික ජනපද හා කාර්මික පුර වැඩසටහන, දක්ෂිණ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම, දුෂ්කර හා වඩාත් දුෂ්කර යයි හඳුනා ගත් ප්‍රදේශවල කර්මාන්ත පිහිටුවන්නන් සඳහා දිරි ගැන්වීම් සැපයීමේ ප්‍රතිපත්තියද ඇතුළත්ය.

දුර පළාත්වල පවතින යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීමේ ගැටළුව මඟ හැරවීම සඳහා රජය විසින් ප්‍රාදේශීය කාර්මික උද්‍යාන වැඩසටහන දියත් කර ඇත. කම්හල් ගොඩනැගිලි, මාර්ග පහසුකම්, විදුලිය බලය, ජලය, විදුලි සංදේශ සහ අප ද්‍රව්‍ය ඉවතලීමේ පහසුකම් වැනි යටිතල පහසුකම් සපයමින් මෙම වැඩසටහන යටතේ පිහිටුවන ලද සීතාවක කර්මාන්ත උද්‍යාන පුරයෙහි ඉදි කිරීම් කටයුතු, 1998 වර්ෂයේදී අවසන් කරනු ලැබීය. සීතාවක කාර්මික උද්‍යානයෙහි කම්හල් සඳහා බිම් කොටස් අලෙවි කිරීමේ

කටයුතු 1998 ජූලි මසදී ආරම්භ කරන ලදී. ආහාර සැකසීම, මැණික් සහ ස්වර්ණාභරණ, ඇඟළුම්, විද්‍යුත් හා විද්‍යුත් නිෂ්පාදන, දුවමය ගෘහ භාණ්ඩ, රබර් ආශ්‍රිත කර්මාන්ත හා විද්‍යුත් උපාංග එකලස් කිරීම වැනි වඩාත් පරිසර හිතකර කර්මාන්ත මෙම උද්‍යානයෙහි පිහිටුවීමට දිරි ගන්වන ලදී. අක්කර 300 ක් වසා පැතිරෙන මතුගම කාර්මික උද්‍යානය ඉදි කිරීම සඳහා මූලික වාර්තාව දැනටමත් සකස් කර ඇත. දකුණු පලාතේ බටඅත පිහිටි අක්කර 105 ක රජයේ ඉඩමක් අවශ්‍ය යටිතල පහසුකම් සහිතව අපවිත්‍ර ජලය ඉවත ලැමේ යන්ත්‍රාගාරයක්, ඝන අප ද්‍රව්‍ය ඉවතලැමේ ක්‍රමයක්ද ඇතුළුව කාර්මික උද්‍යානයක් පිහිටුවීම සඳහා සංවර්ධනය කෙරෙමින් පවතී.

අවශ්‍ය යටිතල පහසුකම් සපයමින් මල්වත්ත, මීරිගම සහ වතුපිටිවල කුඩා අපනයන සැකසුම් කලාප පිහිටුවීමට ආයෝජන මණ්ඩලය පියවර ගෙන ඇත. ඉදි කිරීම් කටයුතු නිම කිරීමෙන් පසු මල්වත්ත කුඩා අපනයන සැකසුම් කලාපයෙහි කර්මාන්ත 11 ක් සඳහා ඉඩකඩ සැලසෙනු ඇත. පුද්ගලයින් 5,000 ක් සඳහා මෙම ව්‍යාපෘතියෙන් රැකියා සැපයිය හැකි බවට ඇස්තමේන්තු කර ඇත. හෙක්ටයාර 40 කට වඩා වැඩි ප්‍රමාණයක පැතුරුණ මීරිගම කුඩා අපනයන සැකසුම් කලාපය තුල කර්මාන්ත ඒකක 15 ක් සඳහා ඉඩ පහසුකම් ඇත. මෙම උද්‍යානයෙහි ඉදි කිරීම් කටයුතුවල මුල් අදියර 1999 මැද භාගයේදී අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. අක්කර 27 කින් සමන්විත වතුපිටිවල කුඩා අපනයන සැකසුම් කලාපයෙහි කම්හල් 20 ක් සඳහා ඉඩකඩ සැපයෙනු ඇත.

ප්‍රාදේශීය කාර්මික ජනපද සංවර්ධන වැඩසටහන යටතේ හෝමාගම, මිනුවන්ගොඩ, කරන්දෙනිය, බෙලිඅත්ත, පන්නල, උඩුකාව, මාතලේ, දංකොටුව, අම්පාර, කුරුවිට, කළුතර සහ තමන්කඩුව ප්‍රදේශයන්හි කාර්මික ජනපද 12 ක් ඉදි කිරීමේ කටයුතු 1997 සහ 1998 දී ආරම්භ කෙරිණි. අක්කර 324 ක් පුරා පැතිරුනු මෙම ජනපදයන්හි කම්හල් 225 ක් සඳහා ඉඩපහසුකම් සැලසෙනු ඇත. 1998 අවසානය වනවිට ආයෝජකයන්ට බිම් කැබලි 80 ක් පවරා දෙන ලද අතර මේ භූමිභාගවල කාර්මික ව්‍යාපෘති 17 ක් පුද්ගලයින් 3,460 කට රැකියා අවස්ථා සලසමින් වාණිජමය කටයුතුවල නිරතව තිබුණි. කුරුණෑගල, අනුරාධපුර, නුවරඑළිය, අම්පාර, ත්‍රිකුණාමලය, මඩකලපුව, වවුනියාව, යාපනය, මොනරාගල සහ මහනුවර යන දිස්ත්‍රික්කයන්හි තවත් කාර්මික ජනපද 15 ක් පිහිටුවීම සලකා බලමින් පැවතින. මෙම වැඩසටහන යටතේ සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන මුළු බිම් ප්‍රමාණය අක්කර 335 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙම කාර්මික ජනපදවල පුද්ගලයින් 15,000 කට රැකියා අවස්ථා සැලසීමට හැකි වන බව ඇස්තමේන්තු කර ඇත. ප්‍රදේශයට විශේෂිත වූ ගැටළු හඳුනා ගැනීමට වැඩි අවධානයක් යොමු කරමින් ආර්ථික කටයුතු නඟා සිටුවීම අරමුණු කරගත් මධ්‍යස්ථාන කිහිපයක් පිහිටුවීමටද 1999 අයවැය මඟින් යෝජනා කර ඇත. දිවුලපිටිය හා දඹුල්ලෙහි එවැනි ආර්ථික මධ්‍යස්ථාන ඉදි කිරීම 1998 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.

වර්ෂය අවසානයේදී ඇඟළුම් කම්හල් 200 වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 21 ක ඇඟළුම් කම්හල් 160 ක් ලියාපදිංචි කර තිබුණි. කර්මාන්ත ස්ථානගත වීමෙහි පුළුල් ව්‍යාප්තියක් පෙන්නුම් කරමින් මෙම කර්මාන්ත 160 න් 138 ක්ම එනම්, සියයට 86.2 ක්ම කොළඹ සහ ගම්පහ දිස්ත්‍රිකයන්ගෙන් පිටත පිහිටා තිබුණි. මොනරාගල, මඩකලපුව, ත්‍රිකුණාමලය සහ අම්පාර වැනි දුෂ්කර දිස්ත්‍රික්කවලද කම්හල් පිහිටුවා තිබුණි. මෙම වැඩසටහන යටතේ රත්නපුර සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල කම්හල් 15 බැගින්ද, පුත්තලම සහ මහනුවර දිස්ත්‍රික්කයන්හි කම්හල් 12 බැගින්ද පිහිටුවා තිබුණි. කෙසේ වුවද, 16 හා 17 වන වගන්තිය යටතේ ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ ව්‍යවසායයන් 1,274 න් 939 ක් හෙවත් සියයට 73 ක් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල ස්ථානගතව තිබුණි. 1990 " කර්මාන්ත ප්‍රවර්ධන පනත" යටතේ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයෙහි ලියාපදිංචි වූ කර්මාන්ත 1,747 න් 1,511 ක්ම මෙම දිස්ත්‍රික්ක දෙකෙහි ස්ථානගතව පැවතුණි.